පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම: **සබරගමුව පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන**
පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා
සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ
හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 492

நிறுவனத்தின் பெயர் : உள்ளூராட்சி நிறுவனங்கள்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்பித்தல்.

Parliamentary Series No. - 492

Name of the Institution: Local Government under the Sabaragamuwa Provincial Council
Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on public Accounts in terms of standing order No.119(4)

සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල මූල්‍ය අනුකූලතාවය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මගින් ඇගයීම 2023 මුදල් වර්ෂය

(පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා 492)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා 492 පිටු අංකය	වාර්තාවෙන් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
314	**ආයතනයේ නම : කෑගල්ල නගර සභාව**	
	සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පෙබරවාරි 28 දිනයට පෙර ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට නියමිත දිනට පෙර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරයි.
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	විගණන මතයට අදාල වූ කරුණු සම්බන්ධයෙන් අදාල නිලධාරීන් දැනුවත් කර නිවැරදි කිරීම් සිදුකර ඇත.
	කොන්ත්‍රාත් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට කොන්ත්‍රාත් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යයි.
	ණය ගැති ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි	මේ වන විට ණයගැති ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යයි.
	මිණුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි	මේ සම්බන්ධයෙන් ඉදිරියේදි කටයුතු කෙරේ.

	ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ඇස්තමේන්තු ලෙජරය යාවත්කාලීනව පවත්වාගෙන යයි.
	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යයි.
	සභාව විසින් වියදම් සීමාවන් තීරණය කර නගරාධිපතිවරයා/සභාපතිවරයා සහ නිලධාරින් වෙත පැවරීමක් සිදු කර නොතිබුණි.	මේ වන විට වියදම් සීමාවන තීරණය කර පැවරීමක් සිදු කර ඇත.
	මුදල් රෙගුලාසි පරිදි ආයතනය තුල මුල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි.	මුල්‍ය බලතල පැවරීමට සම්බන්ධව ඉදිරියට කටයුතු කෙරේ.
	මුල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුල සන්නිවේදනය කර නොතිබුණි	මේ සම්බන්ධව ඉදිරියට කටයුතු කෙරේ.
	මුල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙණුවක්ම ප්‍රමාණවත් තරම් පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි	මේ සම්බන්ධව ඉදිරියට කටයුතු කෙරේ.

	ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	මේ වන විට ප්‍රවර්තන වර්ෂයට අදාල ප්‍රධාන සංයුක්ත සැලැස්ම සකස් කොට ඇත.
	සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි.	මේ වන විට ප්‍රවර්තන වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට සම්මත කොට ඇත.
	සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි	මේ වන විට ප්‍රවර්තන වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සකස්කොට ඇත
	සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනයට අනුමත කර ගෙන නොතිබුණි.	මේ වන විට ප්‍රවර්තන වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කොට ඇත.
	මු.රෙ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ සම්බන්ධව ඉදිරියේ දී කටයුතු කෙරේ.
	විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි.	මේ වන විට විගණන හා කලමනාකරණ කමිටු නියමිත පරිදි පවත්වාගෙන යයි.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තතා, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2025 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂන නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතියි.
	වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයක දී අපහරණය කර	වාහන අපහරණය කිරීමට අදාල ක්‍රියාමාර්ග සිදුකරමින් පවතියි.

	නොතිබුණි. බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම ප්‍රකාශවලින් අනාවරණය වූ ශේෂ සම්බන්ධව අදාළ ගැලපීම් සිදුකර ඇත.
315	**ආයතනයේ නම :රඹුක්කන ප්‍රාදේශීය සභාව**	
	මිනුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මෙම ලේඛණ අවශ්‍ය වන්නේ ද්‍රව්‍ය සපයා සිදුකරනු ලබන කර්මාන්ත ඉටුකිරීමේදීය. සභා මගින් සිදුකරනු ලබන සංවර්ධන කටයුතු සියල්ලම කොන්ත්‍රාත් ප්‍රධානය කිරීම මගින් ඉටුකරගනු ලබන අතර එම හේතුව නිසා මිණුම් පොත් යාවත්කාලීන කිරීමක් සිදු වී නොමැත
	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මෙම ලේඛණ අවශ්‍ය වන්නේ ද්‍රව්‍ය සපයා සිදුකරනු ලබන කර්මාන්ත ඉටුකිරීමේදීය. සභා මගින් සිදුකරනු ලබන සංවර්ධන කටයුතු සියල්ලම කොන්ත්‍රාත් ප්‍රධානය කිරීම මගින් ඉටුකරගනු ලබන අතර එම හේතුව නිසා මිණුම් පොත් යාවත්කාලීන කිරීමක් සිදු වී නොමැත.
	සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2025,2026 වර්ෂවල සංයුක්ත සැලැස්මට අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත.
	සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනයට අනුමත කර නොතිබුණි	2025,2026 වර්ෂවල ප්‍රසම්පාදන සැලැස්ම නියමිත දිනට අනුමත කර ඇත.
	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි.	2025 වර්ෂයේ කාර්තු 04 ට අදාල රැස්වීම් පවත්වා ඇත. 2026 වර්ෂයේද අදාල කටයුත්ත නියමිත පරිදි සිදුවෙමින් පවතී.

	ව්‍යාපාර බදු හා වෙළෙඳ බලපත්‍ර බදු අයකර ගැනීම සඳහා සමීක්ෂණ පැවැත්වීමක් සිදු කර නොතිබුණි.	2025,2026 අදාල සමීක්ෂණ සිදු කර ඇත.
	ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි.	2025 දක්වා නඩු කටයුතුවලට එළඹ නොමැත. 2026 වර්ෂයේ නඩු කටයුතු ආරම්භ කිරීමට විෂය නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.
	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	අදාල වෙබ් අඩවිය තුළ මහජන පැමිණිලි සහ ප්‍රසංශා සටහන් කිරීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.
	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස්කිරීමට වැඩපිළිවෙලක් නොතිබුණි.	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීම සහ අපහරණය කිරීම සංකීර්ණ ක්‍රියාවලියකි. මෙම කටයුත්තේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදුකරනු ලබන කටයුතුවලදී අවශ්‍ය දායකත්වය සපයාදීම සභාව විසින් සිදුකරනු ලබයි.
	වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථානවලින් හා ආයතනයවලින් රැස්කරණු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි. ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	මෙම කටයුත්ත මේ දක්වා සිදුකර නොමැත.
	2018.01.24 දිනැති අංක 05/2018(1) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ	සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර නිල වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. ආයතනය තුළ ප්‍රදර්ශනයට අවශ්‍ය කටයුතු මේ වනවිට ක්‍රියාත්මක

	අමාත්‍යාංශයේ චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය නිසි ලෙස පිළියෙල කර ප්‍රදර්ශනය කර නොතිබුණි.	කරමින් පවතී.
	ආයතනයේ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි	අනවශ්‍ය වැඩ පියවර ඉවත්කර සේවාලාභී ප්‍රඥප්තිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරයි.
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රා.ප.ව. විධිවිධාන නිසි පරිදි සකස් කරන ලද මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්මක් මේ වන තෙක් සකස් කර නොමැත.
	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 ට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2025 වර්ෂයේ පුහුණු වැඩසටහන් 33 ට නිලධාරීන් සහභාගීකරවා ඇත. කාර්ය මණ්ඩලයෙන් 100% ක් පුහුණු වැඩසටහන් සඳහා සහභාගීකරවා ඇති අතර ඉන් 70% ට පමණ අවම වශයෙන් පැය 12 පුහුණු අවස්ථාවන් සලසා ඇත.
	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම් කර නොතිබුණි.	මේ දක්වා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර නොමැත.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බදවාගෙන තිබුණි.	සංවර්ධන නිලධාරීන්ට අදාළව පමණක් අනුමත සීමාව ඉක්මවා නිලධාරීන් ඇති අතර අදාළ පත්කිරීම් සබරගමුව පළාත් සභාව විසින්

		සිදුකර ඇත.
	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතුණි	2025 වර්ෂයේ සැලසුම්ගත පුහුණු වැඩසටහනින් 17% පමණ ක්‍රියාත්මක කර ඇත.
	2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළයුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	මෙම කාර්යය මේ දක්වා සිදුකර නොමැත.
	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2025 වර්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙකු හැර ඉතිරි සියලු දෙනාගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.
316	**ආයතනයේ නම : රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටයම් / ව්‍යාවන මට්ටයම්/ අභිතකර මට්ටමේ විය.	ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නත්ත්වාගණනය කළ මතයක පවතී.
	ණයගැති ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි	මීට පෙර වර්ෂවල ණයගැතියන් සම්බන්ධ තොරතුරු ගොනුවක් ලෙස පවත්වාගෙන ගොස් ඇති අතර 2025 වර්ෂයේ සිට ලේඛනයක් ලෙස යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි
	ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මෙම ලේඛනය ආයතනය සතුව පවතින නමුත් දීර්ඝ කාලයක සිට ගල් හා බොරළු මිල දී ගැනීමක් සිදු නොවන බැවින් යාවත්කාලීන කිරීමක් සිදුකළ නොහැකි බව කාරුණිකව පෙන්වාදෙමි

	මාසිකව වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලන කර සහ අදාළ සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර නොතිබුණි.	වැටුප් පාලන ගිණුමක් සකස් කිරීම හෝ පාලන ගිණුම තුලනය කිරීමක් සිදු නොකරන බව කාරුණිකව දන්වමි.
317	**ආයතනයේ නම :අරණායක ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	අවිනිශ්චිත ගිණුමක් පවතින බැවින් මේ වන විට ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය තත්වාගණනය කරන ලද විගණන මතයක් වන අතර අවිනිශ්චිත ගිණුම් නිරවුල් කර ගැනීමට කමිටුවක් පත් කර කටයුතු කරමින් පවතී.
	මිණුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මෙවන විට යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
	ගොඩනැගිලි අයදුම්පත් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මෙවන විට යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
	අනුකූලතා සහතික ලබාදීමේ ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මෙවන විට යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
	ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. ද්‍රව්‍ය භාරදීමේ ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මෙවන විට යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
	මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	2025 අගොස්තු මස සිට මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
	සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	සුසාන භූමි දෙකක වැට මායිම් සකස් කර ඇති අතර 2026 අයවැයෙන් රු 500,000.00ක මුදලක් වැට මායිම් සකස් කිරීම සඳහා වෙන් කර

	පවරා නොගත් වත්කම් තිබුණි. වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	ඇත.මේ වන විට ඒ සඳහා කටයුතු කරමින් පවතී. පවරා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතී අපහරණ කමිටුවක් පත්කර අපහරණය සඳහා කටයුතු කර ඇතත් එහි ලියාපදිංචි අයිතිය සහාව සතුව නොමැති හෙයින් ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.
317	**ආයතනයේ නම : මාවනැල්ල ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිලිබඳ විගණන මතය, යටත්ව මටටමේ /ව්‍යාවන මටටමේ/ අභිතකර මටටමේ විය. ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. මු.රෙ.ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි . විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් වත් පවත්වා නොතිබුණි.	2023 /12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය කළ මතයක් ලැබී ඇත. මේ වන විට ඇස්තමේන්තු ලෙජරය 2023 වර්ෂයේ සිට මේ දක්වා නිසි පරිදි පවත්වාගෙන යනු ලැබේ. දැනට ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ. සභාව මගින් සෘජු ශ්‍රම පදනම මත ව්‍යාපෘති සිදු නොකරන බැවින් ගල් බොරළු ලේඛනය යාවත්කාලීන වී නොමැත. මේ වන විට ප්‍රධාන සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර ඇති අතර 2024/2025/2026 /වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නියමිත දිනට අනුමත කර ඇත. මු.රෙ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. 2023 වර්ෂයේ කමිටු 03 ක් පවත්වා ඇති අතර 2023 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා වූ විගණන කළමනාකරණ කමිටුව 2024 වර්ෂයේ පළමු කාර්තුවේදී පැවැත් වූ බව කාරුණිකව වාර්තා කරමි.

	සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	වත්කම් වල ආරක්ෂාව සඳහා ගත හැකි ක්‍රියා මාර්ග ගෙන තිබුණ ද සමහර සුසාන භූමි හා ඉඩම් වල මායිම් වැටවල් සකස් කර නොතිබුණ ද වාර්ෂික අයවැය ලේඛන වලත් ප්‍රතිපාදන වෙන් කර ඇති සීමාවන් තුල ප්‍රමුඛතාගත පිළිවෙළට මැණුම් සිදු කර මායිම් වැටවල් සකස් කිරීමට පියවර ගනිමින් පවතින බව කාරුණිකව වාර්තා කරමි. එමෙන්ම මුරකරුවන් යෙදවිය යුතු ස්ථාන සඳහා මුරකරුවන්ද , ගේට්ටු සවිකළ යුතු ස්ථාන සඳහා ආරක්ෂිත ගේට්ටු ද සවි කර ඇති අතර කසළ වාහන ගාල් කිරීම සඳහා ළමා උද්‍යාන භූමියේ රථගාල අසල වාහන නැවතුම් මධ්‍යස්ථානයක් ද සකස් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. එබැවින් වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත සුසාන භූමි වැටවල් හා ඉඩම් සඳහා මායිම් සකස් කිරීමට කටයුතු සැලසුම් කර ඇති බව ද සඳහන් කරමි.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබූ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ වන අතිරික්ත හා ඌනතා සඳහා මේ වන විට මූ.රෙ. 104 (4) පරීක්ෂණ ය සිදු කර දෙන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලීම් කර ලිපි ඉදිරිපත් කළ අතර, දැනට එම පරීක්ෂණ එම කාර්යාලයෙන් සිදු කර අවසන් කර ඇත. එම වාර්තාව ලද පසු ඉදිරි කටයුතු කරමි.
	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	මෙම ගර්හිත වාහන සම්බන්ධව තාක්ෂණික කමිටුවක් මගින් අභාවිත වාහන 14 ක් හඳුනාගෙන දැනට එම වාහන වලින් 05 ක් අළුත් වැඩියා කර ඇත. නිෂ්කාර්යව පවතින GK -7736 ජල බවුසරය විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කරමින් සමුපකාර දෙපාර්තමේන්තුවට ලබා දීමට කටයුතු කරමින් පවතී. අභාවිත සහතික නොගෙන තිබෙන වාහන සඳහා අභාවිත සහතික ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, වාර්තා ලැබී ඇති වාහන අපරණය කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බවත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/AD04/iii වෙළුම හා 2026.03.05 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති පරිදි සබරගමු පළාත් සභාවට අයත් හා සභාව නමින් අපහරණය කළයුතු වාහන පළාත් සභාව හරහා අපහරණය කිරීම සඳහා කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව එම ලිපිය 2026.05.12 දින පැවති මහා සභාවට ඉදිරිපත් කර ඇත. ඒ සඳහා මහා සභාව අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු කරමි.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	මෙම සභාව මගින් බඳවා ගැනීම් සිදු කර නොමැති අතර අනුමත සංඛ්‍යාව ඉක්මවා මෙම සභාවට අනුයුක්ත කර ඇති 2022 වර්ෂයේ බඳවා ගත් සංවර්ධන

		නිලධාරීන් 5 දෙනකු සඳහා නව තනතුරු 5 ක් අනුමත කර ගැනීමට කාර්ය මණ්ඩල සමාලෝචනයේ දී යෝජනා ඉදිරිපත් කර ඇත.තවදුරටත් අතිරික්ත නිලධාරීන් අනුප්‍රාප්තිකයකු රහිතව නිදහස් කිරීමට නිර්දේශ කිරීමට ද, තවත් නිලධාරියෙකු වෛද්‍ය මණ්ඩල නිර්දේශ ලබා ගැනීම යොමුකර ඇත.
318	**ආයතනයේ නම : වරකාපොල ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	2026 වර්ෂයට අදාළව ආයතනයේ ගිණුම් පිළිබඳ තත්වාගණනය නොකළ මතයක් ලබා ගැනීමට කටයුතු කරමි.
	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය මේ වන විට නිසි පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
	මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	මුර පද වෙනස් කිරීම සම්බන්ධව පුහුණුවක් ලබා දී නොමැති බැවින් ඉදිරියේදී මුරපද සම්බන්ධ පුහුණුවක් ලබාගෙන මුරපද වෙනස් කිරීමට කටයුතු කරමි.
	මු.රේ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මු.රේ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් 2026 වර්ෂයේ සිට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
	සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	ස්ථාවර වත්කම් සත්‍යෝක්ෂණයක් සිදු කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටුව මඟින් සත්‍යෝක්ෂණය සිදු කර නිවැරදිව වත්කම් හඳුනාගෙන ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරමි.
	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රේ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කරමි.
	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින්	ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ වලට අදාලව පැවති වලංගු කාලය අවසන්

	අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	වූ වෙක්පත් නියමිත ගිණුම් වලට මේ වන විට බැර කර ඇත.
	ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදුකර නොතිබුණි.	වර්තමානයේ ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.
	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	දිරන හා නොදිරන කසළ එකතු කර කළමනාකරණය කිරීම සඳහා පමණක් සන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය සතුව පහසුකම් පවතින අතර, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම එක්රැස් කිරීමේ වැඩසටහන් සිදු කිරීමේදී ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම හා පහසුකම් සැළසීම සිදු කරනු ලබයි
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	2013 වර්ෂයෙන් පසුව අනුමත කාර්යය මණ්ඩලය යාවත්කාලීන නොවීම මත වර්තමානය වන විට අනුමත තනතුරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පැවති දැඩි සේවා අවශ්‍යතාවය මත දෛනික හා අනියම් පදනම්න් බඳවාගෙන ඇති සේවකයින් හට සේවා ස්ථිරත්වය ලබා දීම සඳහා අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කිහිප අවස්ථාවකදීම ඉල්ලීම් කර ඇත.
318	**ආයතනයේ නම : ගලිගමුව ප්‍රාදේශීය සභාව**	
	මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023/24 වර්ෂ වලට අදාලව විගණන වාර්තා සකස් කර ඇති අතර එය විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරන බවට කාරුණිකව වාර්තා කරමි.

	වාහනයක් ගර්භිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	මේ වන විට සියලු වාහන අපහරණය කර ඇති බව කාරුණිකව දන්වමි.
	වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථානවලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	2025 වර්ෂයේ ව්‍යාපාර ස්ථාන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය සඳහා ගිවිසුම්වලට එළඹ ගාස්තු අයකරනු ලබන බව වාර්තා කරමි.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	බඳවාගැනීම් සිදුකර අනුයුක්ත කිරීම සිදු කර ඇත්තේ පළාත් සභාව විසින් වන අතර මෙම සභාව විසින් කාර්යමණ්ඩල බඳවාගැනීම් කිසිවක් සිදු කර නොමැති බව කාරුණිකව දන්වමි.
319	**ආයතනයේ නම :යටියන්තොට ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ /අභිතකර මට්ටමේ විය	2024/ 2025 වර්ෂ සඳහා තත්ත්වා ගණනය කළ මතය ලැබී ඇත.
	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනයක් නිසි පරිදි යාවත් කාලීන කරමින් පවත්වාගෙන යන බව කාරුණිකව දන්වා සිටිමි.
	ගල් බොරළු ලේඛනය නිසි පරිදි යාවත් කාලීනව පවත්වා නොතිබුණි	යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ගල් බොරළු ලේඛනයක් පවත්වාගෙන ගොස් නැති බවත්, අවශ්‍යතාවය අනුව ඉදිරියේදි අවශ්‍යතාවයක් ඇති වුවහොත් ගල් බොරළු ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි
	මු.රෙ.ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	2023 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණද ඉදිරියේ දි එය නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
	විගණන හා කළමනාකරණ කමිටු	පසුගිය වර්ෂවල නොවැළැක්විය හැකි හේතූන් මත වසරක් තුළ විගණන

	රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි	කළමනාකරන කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීමට නොහැකිව තිබූ අතර, ඉදිරියේදී නියමිත කාල වකවානුවල විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වසරකට වාර 04 ක් පැවැත්වීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි
	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි	මේ වන විට අපහරණ ක්‍රියාවලියට අදාල කටයුතු බොහොමයක් නිම වී ඇති අතර ඉදිරියේ දි අපහරණ ක්‍රියාවලිය ප්‍රමාදයකින් තොරව කරගෙන යාමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බදවාගෙන තිබුණි.	මේ වන විට නිවැරදි කිරීමට කටයුතු කර ඇත
	සැලසුම් ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණයට 50% වඩා අඩු මට්ටමක පැවතුණි	ඉදිරි වර්ෂ වලදී මෙම තත්ත්වය මහහරවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි
319	**ආයතනයේ නම :දැරණියගල ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳව විගණන මතය, යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය	විගණනය විසින් තත්ත්වාගණනය කරන ලද මතයක් ප්‍රකාශ කර ඇති අතර එමගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කරමින් ගිණුම් කටයුතු සිදු කරනු ලැබේ.
	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.	1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 171 හා 173 වන වගන්ති සමග කියවිය යුතු එම පනතේ 184 වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය රීති සංග්‍රහයේ 92 වන රීතියට අනුව ද්‍රව්‍ය භාර දීමේ ලේඛනය (ප්‍රා ස 41) යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ.
	ගල් බොරළු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන නොතිබුණි.	ගල් බොරළු ගබඩා කර නිකුත් කිරීමක් මෙම ප්‍රාදේශීය සභාව මගින් සිදු නොකරන බැවින් ලේඛනයක් නඩත්තු කර නොමැති අතර 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 171 හා 173 වන වගන්ති සමග කියවිය යුතු එම පනතේ 184 වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද

		1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහයේ 92 වන රීතියට අනුව ගබඩා ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය (ප්‍රාස 42) සකස් කර ඇත.
	අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම.	සබරගමුව පළාත් සභාවේ අභ්‍යන්තර විගණන අංශය මගින් නිකුත් කර ඇති විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් වන බැවින් ආයතනයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත යොමු කර නොමැත. ඉදිරියේදී නිකුත් කරනු ලබන අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.
	වාහනයක් අපහරණය වී මාස 8 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට අපහරණ කමිටුව පත්කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලීම් කළ ද මේ දක්වා එම කමිටුව පත් කර නොමැති බැවින් අපහරණ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. එසේම වාහන යන්ත්‍ර අපහරණය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 මගින් පෙන්වා දී ඇති කරුණුවලට අනුව හදුනාගැනීමේ කමිටුව සඳහා නිලධාරීන් නම් කර යොමු කර ඇත.ඒ අනුව අපහරණ කමිටුව පත් කළ වහාම විධිමත් පරිදි අපහරණ කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
	ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට අවස්ථාව සලසා නොතිබීම	මෙම සභාවේ වෙබ් අඩවිය මගින් ඊ මේල් හා මුහුණු පොත හරහා පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට අවස්ථාව සලසා ඇති අතර පැමිණිලිවලට අදාලව කඩිනමින් කටයුතු කරනු ලැබේ. එසේම මෙම සභාවේ වෙබ් අඩවිය සක්‍රීයව ක්‍රියාත්මක වන බව දන්වමි.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බදවා ගෙන තිබීම	මෙම සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩලය 72 කි. ඉන් තනතුරු 09කට අදාලව පුරප්පාඩු 12 කි. නව ස්වයං උත්පාදන ආදායම් මාර්ග හදුනාගැනීම, සිතියම්ගතකරණය. සභාව මගින් සැපයෙන කාර්යයන් පරිගණක ගත කිරීම, මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ සේවා සැපයීම, ජල සේවා පුළුල් කිරීම, වරිපනම් ඒකක වර්ධනය කර ගැනීම ආදී ක්‍රියාවලි හේතුවෙන් පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති කාර්යයන් පුළුල් වී ඇති බැවින් මෙම සභාවේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාමට දැනට පවතින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවේ. මෙම සභාවේ කාලීන අවශ්‍යතා මත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට අදාලව 2025 වර්ෂයේ කාර්ය මණ්ඩල සමාලෝචන රැස්වීමේදී තවදුරටත් මෙම සභාව

සඳහා දැනට අනුමත කාර්ය මණ්ඩලයට අමතරව පහත පරිදි තනතුරු ඇති කර දෙන ලෙසට ඉල්ලීම් කරන ලදී.

	තනතුරු	අවශ්‍ය තනතුරු සංඛ්‍යාව
01	සංවර්ධන නිලධාරී	05
02	මහජන සෞඛ්‍ය පරීක්ෂක	01
03	රියදුරු	03
04	වැඩ ක්ෂේත්‍ර කම්කරු	03
05	සෞඛ්‍ය කම්කරු	05

එසේ වුව ද එම ඉල්ලීම්වලට සාධාරණ විසඳුමක් යොමුව නැති අතර රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරී කමිටුව වෙත යොමු කරන ලද ඉල්ලීම් ප්‍රකාරව මෙම සභාවේ ආදායම් පරීක්ෂක තනතුරු 02, තාක්ෂණික සහායක තනතුරු 01, බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු 01, වැඩ/ක්ෂේත්‍ර පරිපාලක තනතුරු 01 වශයෙන් දැනට පුරප්පාඩු ලෙස පවතින තනතුරු 04ක් සඳහා බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබාදීමට අදාලව අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMORRPCM/2025/decision හා 2026.03.12 දිනැති ලිපිය මගින් අමාත්‍ය මණ්ඩල තීරණය දැනුම් දී ඇති බව දන්වා අදාල බඳවා ගැනීම් කඩිනමින් සිදු කිරීමට අදාලව කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම්ගේ අංක DCSPT/11/Cadre/Rec com හා 2026.03.23 දිනැති ලිපිය මගින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් හා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා ඇත. එහි දක්වා ඇති පුරප්පාඩුවලින් මේ වන විට ආදායම් පරීක්ෂක 01 තනතුරක් පමණක් සම්පූර්ණ වී ඇත.

ඒ අනුව මෙම සභාවේ පුරප්පාඩු තනතුරුවල කාර්යයන් හා කාලීනව පළාත් පාලන ආයතනවල පුළුල්වී ඇති කාර්යයන් විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගෙන ඇති සේවකයන් මගින් හා මෙම සභාවේ තත්‍ය කාර්ය මණ්ඩලය

		කළමනාකරණය කර ගනිමින් අදාල කාර්යයන් ඉටු කර ගැනීමට සිදු වී ඇත.
319	**ආයතනයේ නම : බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	2023 වර්ෂය සඳහා ආයතනයේ ගිණුම් සඳහා තත්වාගණනය කළ මතයක් ලැබී ඇත.
	ගල් බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	අප අඩු ආදායම්ලාභී ආයතනයක් බැවින් කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී සහා අරමුදලින් හෝ වෙනත් කිසිදු අරමුදලකින් සෘජු කොන්ත්‍රාත් පිරිනැමීම මගින් කර්මාන්ත සිදු නොකල බැවින් ගල් හා බොරලු ලේඛනයක් යාවත්කාලීන කර නැත.
	මු.රෙ.ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබිණි.	2023 වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නැත. 2026 වර්ෂයේ සිට එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යැවීම සඳහා කටයුතු කරමි.
	සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබිණි.	පළාත් සහා හා ප්‍රධාන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන හරහා ආදාහනාගාරය පිහිටි දෙහල්කලවිට ඉඩම වටා වැටක් ඉදි කර ඇත. ඉතිරි ඉඩම් වල ආරක්ෂාව සඳහා කටයුතු කිරීමට අප ආයතනය සතුව මූල්‍යමය ශක්තියක් නොමැති බැවින් වෙනත් ආයතන වලින් ලැබෙන ප්‍රතිපාදන මත කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි.
	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබිණි.	අප පළාත් පාලන ආයතනට අදාල බල ප්‍රදේශය තුල අඩු ජනගහනයක් ඇති බැවින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රමාණයද ගණනය කළ නොහැකි අතර එක් රැස්වන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රමාණය ද අඩුය.සෑම මසකම 15 හා 30 යන දිනයන් වල නොදිරන කසල ද්‍රව්‍ය රැස් කරන

		අවස්ථාවේදීම මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ද එක් රැස් කරනු ලබයි.
	වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබිණි.	බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේදී හඳුනාගත් මහා පරිමාණ කර්මාන්ත නොමැති හෙයින් දෛනික කසළ ප්‍රමාණයට අමතරව අතිරික්ත කසළ එකතු වීමක් නොමැති බැවින් කසළ බදු පැනවීම සිදුකර නොමැති අතර ඉදිරියේ දී සමීක්ෂණයක් සිදු කර තීරණයක් ගැනීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබිණි.	* 2023 වර්ෂයේදී අනුමත කාර්ය මණ්ඩලයේ සංවර්ධන නිලධාරී තනතුරු 16ක් ඇත. 2021.12.31 දින වන විට සංවර්ධන නිලධාරී පුරප්පාඩු 03ක් පැවතිණි. 2022.01.03 හා 2022.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සංවර්ධන නිලධාරීන් 11 දෙනෙකු අප ආයතනයට යොමු කර ඇත. ඒ හේතුවෙන් 2023.12.31 දින වන විට අතිරික්ත සංවර්ධන නිළධාරීන් 07ක් සිට ඇත.මේ වන විට අතිරික්ත සංවර්ධන නිලධාරීන් නොමැති බව ද දන්වා සිටිමි. * ඊට අමතරව ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය මත 2019 ජනවාරි මස සිට සේවා අවශ්‍යතාව මත මුරකරුවන් 02ක් සේවා ගිවිසුම මත බඳවාගෙන ඇත.ඔවුන් මේ වනවිට සේවයේ යෙදී සිටී.
320	**ආයතනයේ නම :දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ පැවතිය.
	ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඇස්තමේන්තු ලෙජරය යාවත්කාලීන කර ඇත.

	සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	මාගම්මන සුසාන භූමියේ මැනුම් කටයුතු අවසන් කර ආරක්ෂාව සකසා ඇත.අනෙකුත් සියළු වත්කම් මැනුම් කටයුතු සිදුකර ආරක්ෂක වැටවල් ඉදිකිරීමට පියවර ගනිමින් පවති.දෙහිඕවිට ප්‍රාදේශීය සභාව අඩු ආදායම් ලබන ප්‍රාදේශීය සභාවක් බැවින් සහ දැනට කාර්ය මණ්ඩල වැටුප් සඳහා 20% සභාව විසින් දැරීමට සිදු වන බැවින් පවතින ආදායම් තත්වය අනුව වාර්ෂිකව වත්කම් 2ක් පමණ සිදුකිරීමට හැකියාව පවතින බැවින් සහ සමහර වත්කම් සඳහා වැටහිරියා යොදා ගෙන තාවකාලික වැටවල් සකසා ඇත.
	ටෙන්ඩර් මත වාර්ෂිකව දිය යුතු සභාවේ දේපල සමාලෝචිත වර්ෂය තුල දී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.	ප්‍රසම්පාදන ක්‍රමවේදය උපයෝගි කරගනිමින් වත්කම් බදු දෙන අතර පලමුවරට ප්‍රසම්පාදනයෙහි නොගිය වත්කම් 10% අඩුවක් නැවත ටෙන්ඩර් කර ඇත.එසේත් කිසිදු ලෙස බදු නොදුන් වත්කම් පවතින අතර සභාවේ ඉඩම් බදු දීමෙදි ඵලදාව බදු දෙන ඉඩම්වල ඵලදාවෙන් ලැබෙන ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවති.
	වරිපනම් කලාපය ඇතුලත ව්‍යාපාරික ස්ථානවලන් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි	කසළ බදු අය කර ගැනීමට අතුරු ව්‍යවස්ථාවක් පනවා ගත යුතු අතර එම අතුරු ව්‍යවස්ථාව පනවා ගැනීමෙන් පසු බදු අය කර ගැනීමට කටයුතු කරමි.
320	**ආයතනයේ නම : කෑගල්ල ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	තත්ත්වාගණනය කළ මතයක් දක්වා ඇත.
	සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි	1. ගබඩා කටයුතු සඳහා විධිමත් හා ආරක්ෂිත ගබඩාවක් සකස් කර භාවිතයට එක්කර ඇත. 2. අංශ මට්ටමින් වන ඉන්වෙන්ට්‍රි ලේඛන සකස් කර භාණ්ඩ ආරක්ෂාව සම්බන්ධ වගකීම් පවරා ඇත. 3. වාහන වැනි වත්කම් සඳහා ආයතනයේ ධාරිතාවය තුළ ආරක්ෂිත

		පහසුකම් සලසා ඇත.
	හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් සිදු කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට වරෙන්තු නිකුත් කිරීම ක්‍රියාත්මක කර ඇත. නමුත් 2024 වර්ෂය තුළ වරිපනම් බදු අයකිරීම් සම්බන්ධයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ප්‍රගතියක් අත්කරගෙන ඇත. 2023.12.31 දිනට පැවැති වරිපනම් බදු හිඟය රු. 2,037,364.69 කි. 2024.12.31 දිනට වරිපනම් බදු හිඟය රු. 1,420,138.03 කි. 2025.12.31 දිනට වරිපනම් බදු හිඟය රු. 874,722.91 කි. ඒ අනුව 2023 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂය අවසන් වන විට 42.93 % ක ප්‍රගතියක් අත්කරගෙන ඇත.
	වරිපනම් කලාපය ඇතුළත වයාපාරික ස්ථානවලින් රැස්කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි.	සේවාවක් ලෙස ක්‍රියාත්මක කිරීමට නීතිමය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ගාස්තු අයකර නැති බව හඳුනාගත හැක. නමුත් මේ වන විට ගිවිසුම්ගත සේවාවත් ලෙස ගාස්තු අයකරමින් සේවා සැලසීම් සඳහා මූලික පියවර ගෙන ඇත.
	අනුමත සීමාව ඉක්මවා කාර්යමණ්ඩල බඳවාගෙන තිබුණි.	අතිරික්ත කාර්යමණ්ඩලය තුළ තනතුරු සැලකීමේදී අනුමත තනතුරු ප්‍රමාණයට වඩා සෞඛ්‍ය කම්කරු තනතුරු 03ක් සඳහා බඳවාගැනීම් සිදුකර තිබුණද වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 03ක් පුරප්පාඩු පැවත තිබී ඇත. එම නිසා කාර්යමණ්ඩල තනතුරු අතර තුලනය කර සැලකීමේදී බඳවාගැනීමේ සාධාරණබවක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් 2024 වර්ෂයේ සිට එම තත්ත්වය නිවැරදි කර අතිරික්ත ලෙස පෙන්නුම් කිරීම් අවසන් කර ඇත.
395	**ආයතනයේ නම : රත්නපුර මහ නගර සභාව**	

	ආයතනයේ ගිණුම් පිළිබඳ මතය,යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	තත්වාගත කළ මතය
	හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	2026 වර්ෂය වන විට යාවත්කාලීන කර ඇත
	වීථි පහන් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	රත්නපුර මහා නගර සභා සීමාව තුල ඇති වීථි පහන් කණු හා කණු ඇති ස්ථාන නිශ්චිතව හඳුනා ගැනීම සඳහා වීථි පහන් ඉන්වෙන්ට්‍රිය පිළියෙල කිරීමේ ඉදිරි කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. එහි පළමු අදියරය ලෙස G.I.S මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන යටතේ රත්නපුර මහා නගර සභා සීමාව තුල පිහිටා ඇති සියලුම වීථි පහන් කණු පිහිටා ඇති ස්ථාන හා වෙන් වෙන් වශයෙන් වීථි පහන් කණු හඳුනා ගැනීමටත් එහි ඇති බල්බ වර්ගය පිළිබඳ තොරතුරුත් මේ වන විට ලබා ගෙන ඇත . එහි දෙවන අදියරය ලෙස වීථි පහන් කණු අංකනය කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. එම වැඩ සටහන ඔස්සේ රත්නපුර හිදැල්ලන මහා නගර සභා සීමාවේ සිට පැල්වාඩිය මහා නගර සභා සීමාව දක්වා ප්‍රධාන මාර්ගයේ (A04 මාර්ගය) ඇති වීථි පහන් කණු වල අංකනය කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. ඒ සඳහා අවශ්‍ය අංක තහඩු කපා තීන්ත ආලේප කර අංක කිරීමේ කටයුතු අවසන් කර ඇත. නමුත් වීථි පහන් කණු ලංකා විදුලිබල මණ්ඩලයට අයත් වන අතර එම කණු වල අංකනය කරන ලද තහඩු සවි කිරීම සඳහා එම ආයතනයෙන් අවසරය ලැබිය යුතුය. RMC/ED/09/DEV/49/2024-II අංක දරණ 2026.03.09 දිනැති ලිපිය මගින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා ඇති අතර මේ වන තෙක් එම අනුමැතිය හිමිවී නොමැත. අවස්ථා කිහිපයකදීම එම ආයතනය වෙත ගොස් ඒ පිළිබඳව විමසූ විට , අමාත්‍යාංශය සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත් අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබාදීමෙන් අනතුරුව අප වෙත දන්වා එවන බවත් පවසා සිටින ලදී. එම නිසා වීථි පහන් කණුවල අංකනය කරන ලද තහඩු සවි කිරීම සඳහා එම ආයතනයෙන් අනුමැතිය ලැබුනු පසු වීථි පහන් කණු වල අංකනය කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කර ඉදිරියේදී විධිමත් වීථි පහන්

		ඉන්වෙන්ට්‍රියක් පිළියෙල කර නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
	මිනුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව සමයේ මහා පරිමාණ සෘජු කර්මාන්ත සඳහා දෛනික මිනුම් වාර්තා තබා ගැනීම සඳහා භාවිතා කළ ලේඛණයකි.වර්තමානයේ බොහෝමයක් ව්‍යාපෘති කොන්ත්‍රාත් ක්‍රමය යටතේ සිදු කරන බැවින් මෙම ලේඛණය භාවිතයට නොගනී.
	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි	රත්නපුර මහා නගර සභා සීමාව තුල ඇති පැරණි මාර්ග පිළබඳ විස්තර ඇතුළත් මාර්ග ඉන්වෙන්ට්‍රියක් සකස් කර ඇත. G.I.S මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහන යටතේ රත්නපුර මහා නගර සභා සීමාව තුල පිහිටා ඇති සියලුම මාර්ග පිළිබඳ කොරතුරු මේ වන විට ලබා ගෙන ඇත . ඒ අනුව මාර්ග සිතියම් ගත කිරීමේ වැඩ කටයුතු මේ වන විට සිදු කරමින් පවති. එම සිතියම් ගත කිරීමේ කටයුතු අවසන් කල පසු ඉදිරියේදී විධිමත් යාවත්කාලීන කරන ලද මාර්ග ඉන්වෙන්ට්‍රියක් පිළියෙල කර නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
	ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙළ කර නොතිබුණි	මේ වන විට සකස් කර ඇත.
	සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කොට සහා සම්මත කර නොතිබුණි	2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර සභා සම්මත කර ගෙන ඇත.
	සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කර නොතිබුණි	2023 වර්ෂයට අදාළව සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබූ අතර සංයුක්ත සැලැස්ම පිළියෙළ කොට සභා සම්මත කර තිබුණේ 2025 වර්ෂයේදීය.එබැවින් 2027 වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කිරීමේදී සංයුක්ත සැලැස්ම උපයෝගී කර ගෙන ප්‍රසම්පදන සැලැස්ම සකස් කරන බව කාරුණිකව දන්වමි
	විගනකාධිපතිවරයා විසින් ඉදිරිපත්	මේ වන විට සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත.

	කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි	
	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04ක් වත් පවත්වා නොතිබුණි.	කාර්තු 03ක් පවත්වා ඇත.පළමු කාර්තුව 2023.04.03 දින පැවැත්වීමට නියමිතව තිබූ අතර එදින විගණන අධිකාරීතුමියට නොවැළැක්විය හැකි හේතුවක් මත රැස්වීමට සහභාගි වීමට නොහැකි බව දන්වා තිබූ බැවින් 2023.07.13 දින පැවති දෙවන කාර්තු රැස්වීමේදී අදාළ කාරණා සාකච්ඡා කරන ලදි.
	සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි	මහා නගර සභාව සංස්ථාපනයේ දී ලද එහෙත් ඒ වන විට නිසි හඳුනාගැනීමක් කර නොතිබූ දේපල මේ වන විට 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ සකස් කරන ලද කැඩැස්තර සිතියම් මාර්ගයෙන් හඳුනාගෙන මහා නගර සභාව සතු හිමිකම් ලේඛන ඉදිරිපත් කර හිමිකම් සහතික ලබා ගැනීමට කටයුතු කර ඇත. ඊට අමතරව නගර මධ්‍යයේ ඇති මහා නගර සභාව සතු ඉඩම් හැර නගරයෙන් පරිභාහිරව ඇති විශාල ඉඩම් කොටස් ප්‍රතිපාදන ලැබෙන පරිදි මැණ කම්බි ගැසීම් සිදු කර ඇති බව දන්වා සිටිමි. උදා - • අංගම්මන ටැංකි කැලය (අක්කර 261) • පොම්පකැලය නොහොත් උදයාල කන්ද මූකලාන (අක්කර 76) • ගෝණකුඹුර සේවා මධ්‍යස්ථානය පිටුපස ඇති තිරිවනාකැටිය පොදු වැසිකිළිය පිහිටා ඇති භූමිය (පර්.29.5) • ගොඩිගමුව ප්‍රජා ශාලාව සඳහා පරිත්‍යාග කර ඇති පර්. 15 ක ඉඩම
	වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ට අනුව වාහන අපහරණය කිරීමේදී අපහරණය කළයුතු වාහන හඳුනා ගැනීමට සමීක්ෂණ මණ්ඩලයක් පහත පරිදි පත්කළ යුතු වේ. I. සභාපති - ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු II. සමාජික - යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක්/කාර්මික නිලධාරියෙක් III. සමාජික - ආයතනයේ වත්කම් සම්බන්ධයෙන් වගකීම දරණ මාණ්ඩලික නිලධාරියෙකු

		ඉහත පරිදි සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව තෝරාගත් වාහන අපහරණය කිරීමට එම වාහන තත්සේරු කළයුතු බැවින් 01/2020 චක්‍රලේඛ ප්‍රකාරව වාහන තක්සේරු කමිටුව පහත පරිදි පත් කළ යුතු වේ. I. සභාපති ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු (දීප ව්‍යාප්ත සේවයක 1 පන්තියේ නිලධාරියෙකු) II. සාමාජික - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයෙක් III. සාමාජික - යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක්/තාක්ෂණික නිලධාරියෙක් IV. සාමාජික - අවශ්‍යතාවය පරිදි ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ගණන් දීමේ නිලධාරි විසින් පත්කරනු ලබන වෙනත් නිලධාරීන් දෙදෙනෙකු ඒ අනුව ඉහත පරිදි චක්‍රලේඛ ප්‍රකාරව කමිටු සඳහා බාහිරින් පත්කරගන්නා නිලධාරීන්ගේ කාර්යය බහුලත්වය මත දින වෙන් කර ගැනීමේ ගැටලු නිසා වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයක් තුළ අපහරණය කර අවසන් කිරීම ප්‍රායෝගිකව ගැටලුවක් වී ඇත. කෙසේ නමුත් 2025 වර්ෂය වන විට සමීක්ෂණ මණ්ඩල මඟින් හඳුනාගත් සභාවේ අපහරණය කළයුතු වාහන 03 ක් අපහරණය කර අවසන්ව ඇත. එම තොරතුරු පහත පරිදි ඉදිරිපත් කරමි. ➢ අංක KU 1557 දරණ ජීප් රථය අපහරණය කිරීමෙන් පසු 2024.02.22 දින ටෙන්ඩර් දමා ඇති අතර අංක 235/C,කඳුබොඩ ,දෙල්ගොඩ පදිංචි කේ.එච්.විතානගේ මහතා වෙත,අංක RMC/SD/13/VEH/70 හා 2024.02.27 දිනැති ලිපිය මඟින් ටෙන්ඩර් ප්‍රධානය කර ඇත. කේ.එච්.විතානගේ මහතා විසින් 2024.02.28 දින ටෙන්ඩර් මුදල වන රු.5,860,753.20 ක් ගෙවා වාහනය රැගෙන ගොස් ඇත ➢ අංක LK 9825 දරණ ටිපර් රථය අපහරණය කිරීමෙන් පසු

		2024.12.27 දින ටෙන්ඩර් දමා ඇති අතර අංක 243/A, කඳුබොඩ,දෙල්ගොඩ පදිංචි එස්.ඒ.මිගාර කසුන් සමරතුංග මහතා වෙත RMC/SD/13/VEH/70 -II හා 2025.01.06 දිනැති ලිපිය මඟින් ටෙන්ඩර් ප්‍රධානය කර ඇත. එස්.ඒ.මිගාර කසුන් සමරතුංග මහතා විසින් 2025.01.06 දින ටෙන්ඩර් මුදල වන රු.633,306.00 ක් ගෙවා වාහනය රැගෙන ගොස් ඇත. ➢ අංක BAF 9776 දරණ යතුරු පැදිය අපහරණය කිරීමෙන් පසු 2024.12.27 දින ටෙන්ඩර් දමා ඇති අතර අංක 243/A,,කඳුබොඩ,දෙල්ගොඩ පදිංචි එස්.ඒ.මිගාර කසුන් සමරතුංග මහතා වෙත RMC/SD/13/VEH/70- II හා 2025.01.06 දිනැති ලිපිය මඟින් ටෙන්ඩර් ප්‍රධානය කර ඇත. එස්.ඒ.මිගාර කසුන් සමරතුංග මහතා විසින් 2025.01.06 දින ටෙන්ඩර් මුදල වන රු.108,560.00 ක් ගෙවා වාහනය රැගෙන ගොස් ඇත.
	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි	2004,2014 ,2015,2016,2018 යන වසරවල සිදුවූ වාහන අනතුරු වලට අදාලව අංක RMC/SD/13/ODT/01(ii වෙළුම) හා 2025.05.05 දිනැති ලිපි මඟින් මු. රෙ ප්‍රකාරව පරීක්ෂණ කමිටු පත් කර ඇත. එහි පරීක්ෂණ වාර්තා ලැබී ඇති අතර එහි නිර්දේශ අනුව පහත වාහන සම්බන්ධයෙන් කටයුතු කර ඇත.එම නිර්දේශ ඇමුණුම 01 පරිදි ඉදිරිපත් කරමි. • අංක PB 6386 දරණ කැබ් රථය • අංක PB 6386 දරණ කැබ් රථය • අංක LF 1102 දරණ ගිණි රථය • අංක 53-2119 දරණ නිසාන් කැබ් රථය • අංක LW-0302 දරණ ගිලන් රථය

		• අංක KU 1557 දරණ කැබ් රථය • අංක BAF 9776 යතුරු පැදිය
	හිඟ හිටි බදු කුළි අය කර ගැනීම සම්බන්ධ අදාළ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	හිඟ මුදල් අය කර ගැනීමට බදුකරුවන් සමග සාකච්ඡා කර ගෙවීම් ක්‍රමවේදයක් අනුව හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව 2023 මුදල් වර්ෂයට අදාළව පැවති හිඟ මුදල් බොහෝ ප්‍රමාණයක් මේ වන විට අය කර ගෙන ඇති අතර ඉතිරිය අය කිරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි.
	දීර්ඝකාලීනව බදු දුන් දේපළ සියල්ල සඳහා ගිවිසුම් ගත වී කටයුතු අවසන් කර නොතිබුණි	බිම්බදු පරීක්ෂාවට අදාලව විගණන විමසුම් අංක SGP/RPF/RMC/AQ/2018/13 හා 2018.10.31 දිනැති විගණන විමසුමට අනුව විගණනයට භාජනය වූ බදුගොනු වලට අදාලව මේ වන විට ගිවිසුම් ගත වීම් සිදුකර ඇති අතර, එම ගිවිසුම්ගත වීමට පෙරාතුව විෂයභාර අමාත්‍යාවරයාගේ අනුමැතිය ප.පා.කොං අංක CLG.LG/5/1/1/2 හා 2019.02.25 දිනැති ලිපියෙන් ලබා ගෙන ඇත. එම ලිපිගොනු අතර පැවති බිම්බදු ගොනු වලින් බිම්සවිය මැනුම් කිරීමේදී රජයේ ඉඩම් ලෙසට ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම් කච්චේරි කර ඇති ඉඩම් කොටස් පමණක් ගිවිසුම් ගත විය නොහැකි ඒවා ලෙස හඳුනාගැනීමෙන් පසු බදු කටයුතු වලින් ඉවත් කර ඇත. සමස්ථයක් ලෙස තක්සේරු වාර්තා ලැබී ඇති හා කැඳවා තිබුණමුත් ගිවිසුම්ගත නොවී සිටි බදුකරුවන් රැසක් සඳහා 1979 අංක 07 දරණ රජයේ ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීමේ පනතේ 03 වන වගන්තියට යටතේ අස් කිරීමේ දැන්වීම් ප්‍රදර්ශනය කර 05 වන වගන්තියට යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කර ඇත. තවද දෙමුවාවත මැණික් වෙළඳ සංකීර්ණයේ කඩකාමර ඇතුළුව කඩකාමර කිහිපයක් සඳහා ගිවිසුම්ගත විම සිදු කර ඇත. අනෙකුත් කඩකාමර සඳහා ගිවිසුම් ගත වීමේ කටයුතු සිදු කරමින් පවතී. 2026 වර්ෂය දක්වා අයකර ගත යුතු බිම්බදු අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඊට අදාල ප්‍රතිචාර නොදැක්වූ බදුකරුවන් ගණනාවකට 1979 රජයේ ඉඩම් සන්තකය පවරා ගැනීම යටතේ නඩු

	දීර්ඝකාලීනව බදු දුන් දේපළවලින් වාර්ෂිකව අයකළ යුතු බදු කුළී අය කර ගෙන නොතිබුණු අවස්ථා විය	පැවරීමෙන් පසුව සියළු හිඟ මුදල් ගෙවා අදාල නඩු කටයුතු සාමදාන කර ගැනීමට කටයුතු කර ඇත. ඉහත පනත යටතේ නඩු පැවරීම සඳහා අවශ්‍ය ලේඛන මහා නගර සභාවේ නීති අංශය වෙත යොමුකර ඇත.
	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනා ගෙන නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟාකර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි	මේ වන විට තිරසර අරමුණු සහ ඒවා ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක හා ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නම් කර ඇත.මධ්‍යකාලීන සැලැස්මෙහි ඇතුළත් කර ඇත.
	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි	රත්නපුර මහා නගර සභාව විසින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රැස් කිරීම සිදු නොකරන අතර මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදු කරන බව කාරුණිකව දන්වමි.
	වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතනවලින් රැස්කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	කණාදොළ කසළ අංගනය වෙත රැගෙන එන ව්‍යාපාරික ස්ථාන හා ආයතනවල අපද්‍රව්‍ය ලෝඩ් ප්‍රමාණය අනුව අය කිරීමක් මේ වන විට ක්‍රියාත්මක කර ඇත.
	පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබා ගත යුතු සියළු ආයතන පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.	2026 වර්ෂයේ සිට පාරිසරික අරක්ෂණ බලපත්‍ර අළුත් කල යුතු කර්මාන්ත 15 සඳහා මගේ අංක : RMC/ED/07/EPL/2-I හා 2026.05.29 දිනැති ලිපි මගින් අදාළ එක් එක් කර්මාන්තකරුවන් සඳහා ලිඛිතව අදාළ බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කරන ලෙස ද වලංගු පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් නොමැතිව ඔවුන්ගේ කර්මාණ්ත පවත්වාගෙන යාම 2000 අංක 53 හා 1988 අංක 56 දරණ පනත් වලින් සංශෝධිත වූ 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ විධිවිධානයන්ට අනුව දඩුවම් ලැබිය හැකි වරදක් බව දන්වා යැවීමට

		කටයුතු සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
	මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි	පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන ඇති අතර, ඒ අනුව කටයුතු කරයි. අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර ඇති නමුත් පළාත් සභාව පිහිටුවා නොමැති බැවින් අනුමත කර ගැනීමට නොහැකි වී ඇත.
	අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි	අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමට නොහැකි වී ඇති බැවින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ නොහැකි වී ඇත.
	අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි පිටපතක් මහජනතාවගේ පරිශීලනය සඳහා ප්‍රධාන කාර්යාලයේ තබා ඇත.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි	මේ වන විට වැඩ/ක්ෂේත්‍ර කම්කරු 152 හා සෞඛ්‍ය කම්කරු 71ක් අතිරික්තව සිටින අතර මෙම අයවලුන් දරන්නාට පෞද්ගලික වන සේ ස්ථිර පත්වීම් ලබා ඇති අයවලුන් වේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක DMS/SG/0215 හා 2017.05.04 දිනැති ලිපියෙන් ලද අනුමැතියට අනුව උක්ත පත්වීම් ලබා දී ඇත. එබැවින් 2024.06.11 දිනෙන් පසු මෙම තනතුරු දෙක සඳහා ස්ථිර පදනමින් කිසිදු සේවකයෙකු බඳවා ගෙන නොමැත.
	කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්යය පැවරුම් කර නොතිබුනි.	එම කාලය තුළ ලබා දී නොතිබූ කාර්ය පැවරුම් මේ වන විට ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.
	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මේ වන විට 50% ඉක්මවා පුහුණු අවස්ථා ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. 2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්ය භාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනා ගෙන නොතිබුණි. සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි. නිලධාරීන්ගෙන් රජයට පළාත් සභාවට හෝ සභාවට සිදු වූ පාඩු පූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ වන විට 80%ක් පමණ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත. ප්‍රගතිය මිනුම් කල හැකි කාර්යසාධන දර්ශක වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් කර ඇත. 2025.06.30 දින වන විට සියළුම මාණ්ඩලික නිලධරයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි. 2025.06.30 දින වන විට සියළුම මාණ්ඩලික නිලධරයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වමි. මේ වන විට අය කර ගෙන අවසන්ව ඇත.
396	**ආයතනයේ නම :ඇඹිලිපිටිය නගර සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකාර මට්ටමේ විය.	ඇඹිලිපිටිය නගර සභාවේ 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව විගණකාධිපතිවරයාගේ මතය තත්ත්වාගණනය කළ මතය වේ.

	ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	ගල් බොරලු ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කරන අතර අවශ්‍යතාවය අනුව එය යාවත්කාලීන කිරීමට කටයුතු සිදු කරමි.
	ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබිණි.	ඉදිරි වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.
	සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබිණි.	වර්තමානය වන විට සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර ඇත.
	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම වර්තමානය වන විට පිළියෙල කර ඇත.
	සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	සභාව සතුව පවතින ප්‍රතිපාදන මත පදනම්ව සභාව සතු සියලු ඉඩම්වල කණු සිටුවා මායිම් සළකුණු කිරීමට කටයුතු සිදු කරමින් පවතින අතර, පිඹුරුපත් නොමැති ඉඩම් සඳහා පිඹුරුපත් සැකසීමේ කටයුතු ද මේ වන විට සිදු කරමින් පවතී.
	පවරා නොගත් වත්කම් තිබුණි.	පවරා නොගත් ඉඩම් පවරා ගැනීම සඳහා මහවැලි අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	අලුත්වැඩියා කටයුතු සිදු කර මේ වන විට ධාවන කටයුතු සඳහා යොදා ගනිමින් පවතී.
	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි	මේ වන විට සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
	වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	පල්ලෙගම පොදු වෙළඳපල කඩ කාමරවල පැවති හිඟ මුදල් සියල්ල අය කිරීමට කටයුතු කර ඇත. සමාලෝචිත වර්ෂය වන විට පල්ලෙගම බස් නැවතුම්පල කඩ කාමරවල පැවති හිඟ මුදල වන රු 1,706,433.37 ක මුදලින් මේ වන විට රු

		1,531,513.37 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර තවදුරටත් එක් කඩ කාමරයකට අදාළව රු 174,920.00 ක හිඟ මුදලක් පවතී. එම හිඟ මුදලද අදාළ බදුකරු විසින් මාසිකව රු 10,000.00 බැගින් වාරික වශයෙන් ගෙවීම් සිදු කරන ලබයි. පල්ලෙගම පොදු වෙළඳපල කඩ කාමරවල පැවති හිඟ මුදල් සියල්ල අය කිරීමට කටයුතු කර ඇත. සමාලෝචිත වර්ෂය වන විට පල්ලෙගම බස් නැවතුම්පල කඩ කාමරවල පැවති හිඟ මුදල වන රු 1,706,433.37 ක මුදලින් මේ වන විට රු 1,531,513.37 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර තවදුරටත් එක් කඩ කාමරයකට අදාළව රු 174,920.00 ක හිඟ මුදලක් පවතී. එම හිඟ මුදල ද අදාල බදුකරු විසින් මාසිකව රු 10,000.00 බැගින් වාරික වශයෙන් ගෙවීම් සිදු කරන ලබයි. 2023 වර්ෂයේ නවනගරය පොදු වෙළඳපල කඩ කාමර 12 ක් ටෙන්ඩර් නොවී පැවතීම නිසා අපේක්ෂිත ඇස්තමේන්තු ගත ආදායම ලභා කර ගත නොහැකි වී තිබුණි.මේ වන විට එකී කඩ කාමර 12 ටෙන්ඩර් කර ලබා දී ඇති අතර බදුකරු විසින් ආපසු භාරදුන් කඩකාමර 01 ක් පමණක් නැවත ටෙන්ඩර් කිරීමට ගරු අණ්ඩුකාරතුමිගේ අනුමැතියට යොමු කර ඇත. සභාව සතු පැරණි ගම් සභා ගොඩනැගිල්ල ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය පවත්වා ගෙන යන ලද අතර එහිදී 2018 වර්ෂයේ අප්‍රේල් මස සිට අගෝස්තු මස දක්වා කාල සීමාවට අදාල හිඟ බදු කුලී රු 156,000.00 ක පවතින අතර එම මුදල් අය කර ගැනීමට කටයුතු කළද මේ වන තෙක් එම මුදල් ගෙවීමට අදාල ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරන බව අදාල ආයතනය වෙත දන්වා ඇත. ඒ අනුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙහි ප්‍රධාන ශාඛාව වෙතින් එම මුදල් ගෙවීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. කොරෝනා කාල සීමාවට අදාළ වූ හිඟ මුදල් කපා හැරීම

		සඳහා ගරු ආණ්ඩුකාර අනුමැතියට ඉදිරිපත් කර ඇති අතර වාර්ෂික බදු පදනම් මත ලබා දෙන අනෙක් සියලු කඩ කාමරවල පැවති හිඟ මුදල් සියල්ල මේ වන විට අය කර ගැනීමට කටයුතු කර ඇත. 2023.12.31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් බදු මුදල් වන රු 56,414,122.71 ක මුදලක් පැවති අතර මේ වන විට සමස්ත හිඟ මුදලින් රු 12,059,527.50 ක මුදලක් අය කිරීමට කටයුතු කර ඇත. තවදුරටත් පවතින හිඟ ශේෂය අය කර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් පවතී.	
		පල්ලෙගම පොදු වෙළඳපල කඩ කාමර 52 න් කඩ කාමර 48 ක් ගිවිසුම්ගතව ඇති අතර ගිවිසුම්ගත නොවූ කඩ කාමර 04 න් මුද්‍රා තබන ලද කඩ කාමර 03 ක් හා අතුරු බදු ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමිය වෙත ඉදිරිපත් කළ එක් කඩ කාමරයක් පවතී. මුද්‍රා තබන ලද කඩ කාමර 03 න් කඩ කාමර 02 ක් මේ වන විට ටෙන්ඩර් කිරීමට කටයුතු සිදු කරමින් පවතින අතර ඉතිරි කඩ කාමරය මහ සභා තීරණය අනුව පෙර බදුකරු වෙත බදු අයිතිය නැවත ලබා දීමට ගරු ආණ්ඩුකාර අනුමැතියට ඉදිරිපත් කර ඇත. පල්ලෙගම බස් නැවතුම්පල කඩ කාමර 40 න් කඩ කාමර 11 ක් වාර්ෂික ගිවිසුම්ද කඩ කාමර 25 ක් දීර්ඝකාලීන ගිවිසුම්ද පැවති අතර ගිවිසුම්ගත නොවූ කඩ කාමර 04 න් කඩ කාමර 02 ක් මේ වන විට ගිවිසුම්ගවීමට කටයුතු කර ඇත. ඒ අනුව ගිවිසුම්ගත නොවූ කඩ කාමර 02 ක් පමණක් පවතින අතර එම කඩ කාමර සඳහාද ගිවිසුම්ගතවීමට අදාල කඩ බදුකරුවන් දැනුවත් කර ඇත. 2023 වර්ෂයේදී නවනගරය පොදුවෙළඳපල අදාළ 2018 වර්ෂයේ සිට පැවතෙන කඩ කුළි හා කී මනි හිඟයක් පෙන්නුම් කරයි.වර්තමානය වන විට එකී කඩ කුලි හා කී මනි හිඟයට අදාළව මු.රෙ 104 (අ) පරීක්ෂණයක් ක්‍රියාත්මක කල අතර එහි වර්තාව ප්‍රධාන අමාත්‍යාංශය	

		වෙත යොමු කර ඇති අතර මෙතෙක් නිර්දේශ ලැබී නොමැත.නවනගරය පොදුවෙළඳපල ස්ථිර කඩ කාමර 62 ක් සඳහා ගිවිසුම් ගත වී ඇත.
	හදුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නිම කර නොතිබුණි	මේ වන විට තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නිම කර ඇත
	පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	2023 වර්ෂයේදි සමීක්ෂණය මඟින් හදුනාගත් සියලු කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබා දි ඇත. වර්තමානය වන විට ලබා දිය හැකි සියලු කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබා දි ඇත.
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මේ වන විට මානව සම්පත් සැලැස්ම පිළියෙල කර ඒ අනුව කටයුතු කරමින් පවති.
	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි	මේ වන විට මානව සංවර්ධන සැලැස්ම පිළියෙල කර ඒ අනුව කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවති.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	2023.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව අනුමත සීමාව ඉක්මවා සංවර්ධන නිලධාරීන් 10 දෙනෙකු බඳවා ගැනීම් සිදු කර ඇති අතර එම බඳවා ගැනීම් පත්වීම් බලධාරියා වන සබරගමු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කර ඇත. මේ වනවිට ඉටු කිරීමට අපේක්ෂිත සේවා අවශ්‍යතාවයන් වැඩිවීම හේතුවෙන් කාර්ය මණ්ඩල

		සංශෝධනයක් සිදු කිරීමට ඉල්ලීම් සිදු කර ඇත.
396	**ආයතනයේ නම : බලංගොඩ නගර සභාව**	
	සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කර නොතිබිණි.	2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පෙබරවාරි 29 දින ඉදිරිපත් කර ඇත. වර්ථමානය වන විට පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
	ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ වීම.	පෙන්වා දී ඇති අඩුපාඩු බොහොමයක් වර්ථමානය වන විට නිවැරදි කර ඇත.
	හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබීම	වර්ථමානය වන විට හානි පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
	අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම.	මු.රෙ.. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබාදෙන ලදි.
	කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් පවත්වා නොතිබීම.	2024 හා 2025 වර්ෂවල කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් බැගින් පවත්වා ඇති අතර ඉදිරියේදී වර්ෂයකට රැස්වීම් වාර 4 ක් බැගින් පැවැත්වීමට කටයුතු කරමි
	සැලසුම් ගත පුහුණු අවස්ථා වලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතීම	2023 වර්ෂයේ ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් සැලසුම් කල පරිදි පුහුණු පැවැත්වීමට නොහැකි වුවද 2024, 2025 හා 2026 වර්ෂවල අදාල වෙන්කිරීම් සිදුකල මට්ටමට 50% ඉක්මවා යන පරිදි පුහුණු වැඩ සටහන් පැවැත්වීමට කටයුතු කර ඇත. අදාල පුහුණු වැඩ සටහන් කාර්යාලය, පුස්තකාලය, ආයුර්වේදය, පෙර පාසල යන අංශ හරහා සිදුකරමින් සාධන මට්ටමට ලගාවීමට හැකි වී ඇත.
397	**ආයතනයේ නම : රත්නපුර ප්‍රාදේශීය සභාව**	
	ගිණුම් පිළිබඳ විගණන මතය,	තත්ත්වාගණනය කළ මතය
	විගණන විමසුම් ලේඛණය/ අභ්‍යන්තර	මේ වන විට විගණන විමසුම් ලේඛණය/ අභ්‍යන්තර විගණන විමසුම් ලේඛණය

	විගණන විමසුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	යාවත්කාලීනව පවත්වාගෙන යනු ඇත
	වීදි පහන් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබිණි	මේ වන විට වීදි පහන් ලේඛණය විධිමත් පරිදි සකස් කරමින් පවතී
	මිනුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබිණි	මේ වන විට ක්‍රියාත්මක වේ
	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබිණි	මාර්ග ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යනු ලබයි
	ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබිණි	පවත්වා ගෙන යනු ලබයි
	ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබිණි	පවත්වා ගෙන යනු ලබයි
	ගල් හා බොරළු ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබිණි.	සෘජු කම්කරු ක්‍රමය යටතේ මාර්ග ඉදි නොකරයි.
398	**ආයතනයේ නම : ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**	
	මිනුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මිනුම් පොත් යාවත්කාලීන කර නොමැත.
	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීම සඳහා තොරතුරු රැස් කරමින් පවතී.
	ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	වර්තමානය වන විට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
	ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි	

	යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	වර්තමානය වන විට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්ථා විය.	වර්තමානය වන විට සියලු අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සිදු කරනු ලබයි.
	මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වර්තමානය වන විට අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි.
	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙළ කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙළ කර ඇත.
	සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	මැනුම් නොකරන ලද ඉඩම් වල හැර අනෙකුත් වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කර ඇති අතර මැනුම් නොකරන ලද ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඉඩම් මැනීමේ කටයුතු සිදු කරමින් පවතී.
	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	වර්තමානය වන විට සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි පවතී.
	වාහනයක් ගර්හිත වී මාස 8 ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	මෙම වාහනය පළාත් භාණ්ඩාගරය වෙත භාර දී ඇත.
	හිඟ වරිපනම් අය කර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි.	2023 වර්ෂයේ දී 94% ක් පමණ වරිපනම් බදු ආදායම රැස් කර ඇති අතර වරෙන්තු නිකුත් කිරීමට ප්‍රමාණවත් තරම් හිඟ ආදායමක් නොමැත.

		වර්තමානයේ හිඟ වරිපනම් ආදායම් රැස් කරමින් පවතී.
	ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපළ සමාලෝචිත වර්ෂය තුළදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.	ගලගම බහුකාර්ය ගොඩනැඟිල්ල බදු දීම සඳහා තක්සේරු කිරීමට යොමු කර ඇති අතර බදු දිය යුතු සභාවේ අනෙකුත් දේපළ බදු දීමට කටයුතු කර ඇත.
	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපළ සඳහා එළඹිය යුතු ගිවිසුම් සියල්ල පූර්ණ ලෙස ඉටු කර නොතිබුණි.	වර්තමානය වන විට වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපළ සඳහා එළඹිය යුතු ගිවිසුම් සියල්ල පූර්ණ ලෙස ඉටු කර ඇත.
	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියලු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි.	වර්තමානය වන විට වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියලු බදු මුදල් පූර්ණ ලෙස අයකරගෙන ඇත.
	ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් කර නොතිබුණි.	වර්තමානය වන විට සමීක්ෂණය මඟින් හඳුනාගත් ව්‍යාපාර බලපත්‍ර ලබා ගත යුතු සියලු ආයතන ව්‍යාපාර බලපත්‍ර ලබාගෙන ඇත.2023 වර්ෂයේ වෙළඳ බලපත්‍ර ආදායම 108% කි.
	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වර්තමානය වන විට ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.
	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙළක් නොතිබුණි.	ප්‍රතිචක්‍රීයකරණය කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් නොමැති නිසා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීම සිදු නොකරන ලදි.
	පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබා ගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	වාර්ෂික පරිසර බලපත්‍ර සමීක්ෂණය මඟින් හඳුනාගන්නා පරිසර බලපත්‍ර

	අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.	ලබා ගත් යුතු සියලු ආයතන වෙත, පරිසර බලපත්‍ර ලබා ගන්නා ලෙස නිවේදන නිකුත් කර ඇත. වර්තමානය වන විට අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.
	ආයතනයේ පුරුවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	සේවාලාභීන්ට ඇගයීම් පත්‍රිකාවක් ලබා දීම මඟින් ඇගයීම සිදු කරනු ලබයි.
	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	වර්තමානය වන විට මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර ඇත.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	වර්තමානය වන විට සංවර්ධන නිලධාරී තනතුරු 2 ක් පමණක් අතිරික්තව පවතී.
	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු විය.	වර්තමානය වන විට සැලසුම් කරන ලද සියලු පුහුණු අවස්ථා ක්‍රියාත්මක කරනු ලබයි.
	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	වර්තමානය වන විට විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග හෝ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක 03 ක් හඳුනාගෙන නොතිබුණි. සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග හෝ නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී. 2026 වර්ෂය වන විට ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක 03 ක් හඳුනාගෙන ඇත. වර්තමානය වන විට සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.
399	**ආයතනයේ නම : ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව /ව්‍යාවන මට්ටමේ/ අභිකර මට්ටමේ විය. මිනුම් පොත් යාවත්කාලීන නොතිබුණි. මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	තත්වා ගණනය කළ මතයකි. මේ වන විට මිනුම් පොත් භාවිතා කිරීමක් සිදු නොකරයි. දැනට යාවත්කාලීන කළ මාර්ග ඉන්වෙන්ට්‍රියක් නොමැති අතර, මේ වන විට ජී.අයි.එස්. තාක්ෂණය භාවිතයෙන් මාර්ග සිතියම්ගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බැවින් එම මාර්ග සිතියම්ගත කර ගැසට් කිරීමෙන් අනතුරුව මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කිරීමට කටයුතු කරන බව

		කාරුණිකව දන්වා සිටිමි.
	ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඇස්තමේන්තු ලේඛනයක් නඩත්තු කර තිබුනද නියමිත ලෙජරයක් භාවිතා කිරිමට කටයුතු කරමි
	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ලේඛනය පවතී. ඉදිරියේදී කටයුතු කරමි.
	ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	ගල් හා බොරළු සැපයිමට තොග ගබඩා කිරිමට ඉඩ පහසුකම් නොමැති බැවින් අදාල ලේඛන නඩත්තු කිරීමක් සිදු කර නැත.
	මෘදුකාංගයට අදාල මුරපද තුන්මසකට වරක් වෙන්සකර නොතිබුණි.	මේ වනවිට නිවැරදි කර ඇත.
	සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාද සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	පිළිගනිමි. මේ වන විට නිවැරදි කර ඇත.
	සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් අනුමත කර ගෙන නොතිබුණි.	පිළිගනිමි. මේ වන විට නිවැරදි කර ඇත.
	සියලුම වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	පිළිගනිමි . මේ වන විට නිවැරදි කරමින් පවති.

	වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකිදී අපහරණය කර නොතිබුණි.	2024 වර්ෂයේදී කැබ් රථ දෙකක්,ට්‍රැක්ටරයක්,මහේන්ද්‍රා වර්ගයේ ජීප් රථයක් හා ලෙලන තලනය වෙන්දේසි කරන ලදී. අභාවිත ගලි බවුසර් 02ක් වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමට කටයුතු යොදා ඇත. අභාවිත කම්පැක්ටර් රථය ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලදී. අභාවිත මෝටර් ග්‍රේඩරය සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත භාරදෙන ලදී. මේවන විට පවතින අභාවිත ට්‍රැක්ටරය ,ටෙලරය හා ජල ටැංකිය ජූලි මස සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තක්සේරු මණ්ඩලයකට ඉදිරිපත් කිරීමට නියමිතය.
	සියළුම වාහනවල රාජ්‍ය ලාංඡනය පිංතාරු කර නොතිබුණි.	රාජ්‍ය ලාංඡනය වාහන දෙකක පමණක් ඇති අතර ඉතිරි වාහනවල පින්තාරු කිරීමේ කටයුතු 2026 වසර තුලදී කිරීමට කටයුතු කරමි.
	වර්ෂයට අදාලව බිල්කල ආදායමෙන් අයකිරීම පහළ මට්ටමක විය	බිල් කල ආදායමට වඩා එකතු කළ ආදායම අඩුවී ඇත්තේ වරිපනම් හා උසාවි දඩ යන ශීර්ෂ වල වේ. 2023 වන විට තිබූ හිඟ උසාවි දඩ මේ වන විට අයකර ගෙන ඇති අතර, දේපල තහනම් කිරීමේ කටයුතු මඟින් වරිපනම් හිඟ අයකර ගැනීමේ කටයුතු කරමින් පවති.
	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියළුම දේපළ සඳහා අය විය යුතු සියලු බදු මුදල් පූර්ණ ලෙස අය කර නොතිබුණි.	වාර්ෂිකව ටෙන්ඩර් මඟින් බදු දුන් සියලු දේපළ සඳහා අය විය යුතු මුදල් අයකර ගෙන ඇත.
	ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර බදු අය කර ගැනීම සඳහා සමීක්ෂණ පැවැත්වීමක් කර නොතිබුණි.	2026 වසරේ සිදු කර ඇත.
	ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදුකර	පිළිගනිමි.

	නොතිබුණි.	
	සභාවට අදාල ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා 2025 වර්ෂයේ සිට ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ නිල වෙබ් අඩවිය නිර්මාණය කර පවත්වාගෙන යනු ලැබේ. වෙබ් අඩවි ප්‍රවේශය - https://eheliyagoda.ps.gov.lk ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ නිල වෙබ් අඩවියේ තොරතුරු පනත විස්තර ඇතුලත් කිරීම් යටතේ සභාවේ ප්‍රගාමී තොරතුරු ඇතුලත් කර ඇත.
	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා 2025 වර්ෂයේ සිට ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ නිල වෙබ් අඩවිය නිර්මාණය කර පවත්වාගෙන යනු ලැබේ. වෙබ් අඩවි ප්‍රවේශය - https://eheliyagoda.ps.gov.lk
	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ නිල වෙබ් අඩවියේ මහජන පැමිණිලි හා යෝජනා මගින් විද්‍යුත් පණිවිඩ ආකාරයෙන් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමේ අවස්ථාව සලසා ඇත.
	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	දැනට අප සතුව පවතින කසළ අංගනය තුළට ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය රැගෙන විත් එය කළමනාකරණය කර ගැනීමේ වැඩපිළිවෙලක් මේවන තෙක් සකසා නොමැති අතර ඉදිරි කාලයේදී මේ සම්බන්ධව විධිමත් ලෙස කටයුතු කිරීමට සකසා ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.
	ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා යොමු	මේවන විට මෙම සභාව මගින් ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රතිචක්‍රීකරණ කටයුතු සිදුකරන අතර එයින් පොලිතින් හා ප්ලාස්ටික් බැහැර කිරීමේ ක්‍රමය හා ඒවා විකුණුම් කටයුතු සිදුකිරීම මේවන විට සිදුකරනු ලබයි

	කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් නොතිබුණි.	
	පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.	මේවන විට පළාත් පාලන ආයතන තුලින් ලබාගත යුතු පරිසර බලපත්‍ර පිළිබඳව පරීක්ෂාවක් සිදුකර ඇති අතර බලපත්‍ර ලබාගැනීම සියළුම කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබාගන්නා ලෙස දැනුවත් කිරීම් කර ඇත. ඒ අනුව දැනට පරිසර බලපත්‍ර ලබා ගැනීම සඳහා කර්මාන්තකරුවන් ඉල්ලුම්කරමින් පවතී.
	මහ නගර සභා පනත ආඥා පනතේ 272 වගන්තිය /නගර සභා ආඥා පනතේ 157 වගන්තිය / ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	පනතේ සඳහන් කරුණු xxx අතරින් උප කාරණා 16 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ඇති අතර, මීට අමතරව ආදාහනාගාරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පනවා ගෙන ඇත. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා 02 ක් හා ගොඩනැගිලි සැලසුම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවක් ද පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාවක් ද සකස් කර ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත. ඉහත අතුරු ව්‍යවස්ථාව මගින් ආවරණය නොවන කරුණු වෙනුවෙන් පොදු සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ කටයුතු කරමි.
	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත් වන කාර්ය සාධන ගිවිසුම සකස් කර ගිණුම්ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත් වන සේ කාර්ය සාධන ගිවිසුම සකස් කර නොමැති අතර කාර්ය මණ්ඩලයේ කොටසකගේ ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව ඇත.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන නොතිබුනි.	අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා අතිරික්තව ඇත්තේ සංවර්ධන නිලධාරීන් තිදෙනෙක් පමණි.එම සංවර්ධන නිලධාරීන් රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත බඳවාගෙනඇති අතර ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව වෙත ද අනුයුක්ත කර ඇත.
	සැලසුම් ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක	2022.04.26 දිනැතිව මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා පුහුණු නවත් වන ලෙස දැනුවත් කර ඇත.එම නිසා 2023 වර්ෂයට අදාලව

	පැවතිණි.	කරන ලද පුහුණු වැඩ සටහන් සිමා කරන ලද බැවින් පුහුණු ප්‍රතිශතය 50% දක්වා අඩු වී ඇත. මේ වන විට එම ගැටලුව නිරාකරණය වී ඇත.
	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතුබුණි	2023 විගණකාධිපති වාර්තාවට අනුව 1.2.අ.-ඇ.ඉ 2024 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීම් කර ඇත. 1.2.ඊ ස්ථාවර වත්කම් සම්බන්ධ තොරතුරු සෙවීම ආරම්භ කර ඇත.තැන්පත් ගිණුම් සම්බන්ධ ලේඛන හා තොරතුරු සොයා බැලීම් සිදු කෙරේ. 1.2.2 නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. 1.6.අ.නීතිමය ක්‍රියාමාර්ග ගතහැකි අත්තිකාරම් ගෙවීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. මු.රෙ.104 පරීක්ෂණයක් සිදුකිරීමට කමිටුවක් පත්කර තොරතුරු විමර්ශනය කරමින් පවතී. ඇ.2025 වර්ෂයේ දී ආයතනයේ නිල වෙබ් අඩවිය සකස් කර ඇති අතර, එමගින් සේවාලාභීන්ට සේවාවන් අයදුම් කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. 2.2.3 අ.වරිපනම් හිඟ බදු අය කිරීම සඳහා ජංගම සේවා පවත්වනු ලැබේ. වසර 05 ට වැඩි හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා රතු නිවේදන නිකුත් කිරීමට හා අදාල දිනවල දේපල තහනම් කිරීම සිදු කරයි. 2.2.3.ආ. තොරතුරු යාවත්කාලීන නොවීම මත හිඟ බදු අය කර ඇනීමේ ගැටළුවක් පවතී. ගොවිජන සේවා මධ්‍යස්ථානය හා සම්බන්ධ වී ඉඩම්වල තොරතුරු යාවත්කාලීන කර ගැනීමට කටයුතු කරමින් පවතී. 2.2.3.ඇ.ජලයෙහි ගුණත්වය සම්බන්ධයෙන් තත්ව පරීක්ෂණයක් සිදුකර ඇත. හිඟ බදු අයකර ගනිමින් පවතී. 2.2.4.අ.2026.04.30 දිනට හිඟ බදු මුදල වූ රු.329,985.00 2.2.4.ආ.ගැටළුව විසඳා ඇත. 2.2.5.ආ. දුරකථන කුළුණු සම්බන්ධයෙන් එම ආයතන ලිඛිතව දැනුවත් කර ඇත.

		2.2.5.ඇ.දැන්වීම් පුවරු සම්බන්ධ සමීක්ෂණ සිදු කිරීම සඳහා ආදායම් පරීක්ෂක නිලධාරීන් දැනුවත් කර ඇත. දැන්වීම් පුවරු සඳහා හිඟ මුදලක් නැත. 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කරගෙන ඇත. 3.1.අ.පනතේ සඳහන් කරුණු xxx අතරින් උප කාරණා 16 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන ඇත. තවද ආදාහනාගාරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පනවාගෙන ඇති අතර, ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා 02 ක් හා ගොඩනැගිලි සැලසුම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යාවස්තාව සකස් කර ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත. 3.1.ආ.i පරිභෝජනයට නුසුදුසු බව පෙන්වා දුන් ස්ථාන සඳහා ක්ලෝරින් යොදා පිරිසිදු කිරීමට උපදෙස් ලබා දී ඇත. 3.1.ආ.ii 2023 වර්ෂයේදී ඇහැලියගොඩ සතිපොල භූමිය තුළ බස්රථ ගාල් කිරීම නිසා වැසිකිලි පද්ධතියේ සිට පූතික ටැංකිය දක්වා එලා තිබූ නල පද්ධතිය පුළුදුවීම නිසා මෙම ගැටළුව උද්ගත වී ඇත. 2023 වර්ෂයේදී සිදු කල අලුත්වැඩියාවෙන් පසු නැවත ඒ සඳහා දරා නැත. ගලි බැහැර කිරීම සඳහා ස්ථානයක් නොමැති බැවින් ගලිබවුසර් භාවිතා කර නොමැත. ගලිබවුසර 02 තක්සේරුවක් සඳහා යොමු කර ඇත. 3.3.අ.අලාභයට වගකිවයුතු අයගෙන් මුදල් අයකර ජල බවුසරය සඳහා මෝටරයක් මිලදී ගන්නා ලදී. 3.3.ආ.රු.96,735.00 ක වන්දි මුදල ගෙවා ඇත. පැවරුම්කරනය අත්සන සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට යවා ඇති බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සභාව දැනුවත් කර ඇත. 3.3.ඇ.වාහනය අලුත්වැඩියාව සඳහා රක්ෂණ සමාගමෙන් ලැබුණු මුදලට අමතරව නිසි වියදමක් සභාව විසින් දරා නොමැත.ඊට මු.රෙ.104 පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව ඉන්ධන ලීටර් 44 ට අදාල මුදල හා රියදුරු වැටුපක් ලෙස ගණනය කර ඇති රු.27,720.00 ක මුදල එවකට සිටි වැඩ බලන සභාපති විසින් ගෙවීමට එකඟ වී ඉන් රු.10,000.00 ක්

		2026.05.26 දින ගෙවා ඇත. ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරමි.
	2020.08.28 දිනැති අංක 02/2020 දරන ජාතික රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යය භාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03 හඳුනාගෙන නොතිබුනි.	පිළිගනිමි. 2027 වසරේ දී අදාල පරිදි කටයුතු කරමි.
	සියලුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	කාර්ය මණ්ඩලය තුල වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කල යුතු නිලධාරීන් සංඛ්‍යාව 03 දෙනෙකි. එක් නිලධාරියෙක් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. අනෙක් දෙදෙනා 2023 වර්ෂයට වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී නොමැති අතර උචිත බලධරයා දැනුවත්කර නොමැති බව පිළිගනිමි. 2024 වර්ෂයේ සිට එය විධිමත් පරිදි සිදු කරයි.
	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාල නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	පිළිගනිමි. 2024 වර්ෂයේ සිට එය විධිමත් පරිදි සිදු කර ඇත.
400	**ආයතනයේ නම : කලවාන ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය තත්ත්වාගණනය කළ මතයක් විය.

	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2023 වර්ෂයේ හානියක් හෝ පාඩුවක් සිදු වී නොමැති බැවින් එය පිළිබඳ සටහන් කර නොමැති බව දන්වමි.
	මිණුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මිණුම් පොත් යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.
	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.
	ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ගල් බොරලු ලේඛනයක් මේ වනතෙක් නඩත්තු කර නොමැත.ඉදිරියේදී එම ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරමි.
	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙළ කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට නිවැරදිව විගණන සැලැස්ම සකස් කර නොතිබුණද 2026 සිට විගණන සැලැස්ම සකස් කර ඇත.
	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පවත්වා නොතිබුණද 2025 වර්ෂය සිට කමිටු 04 ක් පවත්වා ඇත.
	සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	2023 වර්ෂයේදී සභාව සතු වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකි විය. එයට හේතු වූයේ සභාව සතු ප්‍රමාණවත් මුදල් තත්ත්වයක් නොමැති වීමයි. 2025 වර්ෂයේදී සභාව සතු වත්කම් හා ඉඩම් පිළිබඳ සමීක්ෂණය හා ඉඩම් සත්‍යාපන්ක්ෂණය සිදු කොට සභාව සතු වත්කම් මෙන්ම ඉඩම් ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන ඇත. ඒ අනුව හඳුනාගත් වත්කම් තහවුරු කරමින් ඒ සම්බන්ධව ගත හැකි ඉදිරි පියවරයන් ගැනීමට අපේක්ෂිතය.

	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	මෙම අභාවිත වාහන සබරගමු පළාත් සභා ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත භාරදීමට කටයුතු ආරම්භ කර ඇත.
	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි.	අදාළ ලේඛන යාවත්කාලීන කර ඒ සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ගවලට යොමු වී හිඟ අයකර ගැනීමට ඉදිරි කටයුතු කරමි.
	හිඟහිටි බදු කුලී අයකර ගැනීම සම්බන්ධව අදාළ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	හිඟ පවතින බදු කුලී සියල්ල 2023 වර්ෂයට අදාළව මේ වන විට අය වී ඇත.
	ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මේ වන විට අන්තර්ජාලය සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර එය සකස් කළ පසුව අදාළ පහසුකම් මහජනතාව වෙත ලබාදෙන බව දන්වමි.
	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සළසා දී නොතිබිණි.	කලවාන ප්‍රදේශය තුළ අන්තර්ජාල පහසුකම්වල ඇති දුර්වලතා හේතුවෙන් අදාළ කටයුතු මහජනතාව වෙත සම්ප්‍රේෂණය වීමේ ගැටළුකාරී තත්ත්වයක් පැන නැඟී ඇත. මේ නිසා සේවා සැපයීමේ ප්‍රවණතාව ලද පසු මෙය ක්‍රියාත්මක කිරීමට හැකි බව දන්වමි.
	හදුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	හදුනාගත් තිරසර සංවර්ධන කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා අවශ්‍ය ජයග්‍රහණ දර්ශක හදුනාගැනීමට කටයුතු කරමින් පවති.

	ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි. කසළ අපහරණය කිරීම/කසළ කළමනාකරණය කිරීම සඳහා සභාව විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් නොතිබුණි.	කලවාන ප්‍රාදේශීය සභාව සතුව නොදිරන කසල වෙන් කිරීමේ මධ්‍යස්ථානයක් නොමැති වූවත් ඒවා ගබඩා කර තැබිය හැකි ඉඩකඩ සහිත ස්ථානයක් හෝ කොම්පෝස්ට් අංගනයක් නොමැති බැවින් විධිමත් කසල කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම දුෂ්කරය. එසේ වුවත් 2024 ජනවාරි සිට ජනනය කළ ස්ථානයේදීම කසල වෙන් කර ලබාගන්නා අතර එක්රැස් වන නොදිරන කසල වෙන් කිරීම සඳහා ඉඩම් කැබැල්ලක් ප්‍රාදේශීය සභාව වෙත නිදහස් කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී
	වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථානවලින් හා ආයතනවලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	අදාළ වර්ෂය වන විට කසළ බදු අය කිරීමේ අතුරු ව්‍යාවස්ථා පනවා නොතිබූ බැවින් කසල බදු අයකර ගැනීමට නොහැකි විය. ඉදිරියේදී ඊට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජණ පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක්	2023 වර්ෂයේ දී සභාවේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු ලබාදීමට අවශ්‍ය මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට නොහැකි වුවත් 2024,2025 මෙන්ම 2026 යන වර්ෂයන්ට අදාළව එම සැලැස්ම සකස් කර ඇත. මේ තුළින් කාර්ය මණ්ඩලය සඳහා අවැසි පුහුණු වැඩසටහන් සභාව විසින් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබයි. සභාවේ කාර්ය මණ්ඩලය නොයෙක් පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ඇත

	සහතික කර නොතිබුණි.	
	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබුණි.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	2023 වසර වන විට කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු නොකර ඇති අතර කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අතිරික්ත සේවකයින් කළමනාකරණය සිදු කරන ලදී.
	සැළසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි	පුහුණු සැලැස්මේ සඳහන් කරන ලද බොහොමයක් වැඩසටහන් පුස්සැල්ල සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ පවත්වා ඇත.
	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ	මේ වන විට ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.
	2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාර්ය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03 හඳුනාගෙන නොතිබුණි.	මේ වන විට ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්ය සාධක දර්ශක හඳුනාගැනීමට කටයුතු කර ඇත.

401	ආයතනයේ නම :බලංගොඩ ප්‍රාදේශීය සභාව	
	ආයතනයයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත් මට්ටමේ /ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමක විය	2024 වර්ෂය සඳහා තත්වාගනාණය කළ මතයක් ලැබී ඇත.
	මිනුම් පොත යාවත්කාලීනව පවත්වා නොතිබිණි	ඉදිරියේ දී මිනුම් පොතක් සකස් කර පවත්වා ගෙන යාමට කටයුතු කරමි.
	ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලින කර නොතිබුණි.	මේ වන විට ඇස්තමේන්තු ලෙජරය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
	ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලින කර නොතිබුණි.	ගල් බොරලු ලේඛනය යාවත්කාලීන කරන ලදි.
	ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබිණ.	2027 වර්ෂයේ සිට නියමිත පරිදි ප්‍රධාන සංයුත්ත සැළැස්ම පිළියෙල කිරීමට උපදෙස් ලබා දෙන ලදි.
	සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර සභා සම්මත කර නොතිබුණි.	ආයතනයේ 2023 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම 2022.11.17 දින තීරණ අංක 05-03 යටතේ නියමිත දිනට සභා සම්මත කර ඇති අතර 2023-2026 වර්ෂ සඳහා සිවි අවුරුදු සැලැස්ම සකස් කර ඇත.
	2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	අදාල වක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙළ කර ඇත.
	සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්ම නියමිත දිනට අනුමත කර නොතිබුණි.	2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැළැස්ම 2023.12.28 දින තීරණ අංක 40 යටතේ නියමිත දිනට අනුමත කර ගැනිමට කටයුතු කර ඇත.

	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා වීම	මේ වන විට අභ්‍යන්තර විගණන විමසුම් සඳහා නියමිත පරිදි නිලධාරින්ගෙන් පිළිතුරු ලබා ගනිමින් පවති.
	මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම.	මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරමි.
	සියලු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොබීම.	සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරමින් පවතී.
	සියලුම වාහන වල රාජ්‍ය ලාංඡන පින්තාරු කර නොතිබීම	සියලු වාහන සඳහා මේ වන විට රාජ්‍ය ලාංඡන ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇත.
	හිහ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් සිදු කර නොතිබීම	2024 වර්ෂයේ සිට නව තක්සේරුව මත පදනම්ව හිහ වරිපනම් අයකිරීමේ කටයුතු මේ වන විටත් සිදු කරමින් පවති.
	ටෙන්ඩර් මත වාර්ෂික බදු දිය යුතු සභාවේ දේපල සමාලෝචිත වර්ෂය තුළදි එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබීම.	2024 වර්ෂයේ දි ටෙන්ඩර් කැඳවා සභාවේ දේපළ නියමිත පරිදි බදු දීමට කටයුතු කර ඇත
	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම ඒ හා සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වාගෙන නොතිබීම.	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් ඉදිරිපත් වන පැමිණිලි ලේඛන ගත කිරීම හා ඒ හා සම්බන්ධ ගනු ලැබූ ක්‍රියා මාර්ග පැහැදිලි කරන ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබේ.
	හදුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රණ දර්ශක නියම	2026- වර්ෂයේ සිට ප්‍රගතිය මැන බැලීමට හා ජයග්‍රහණ දර්ශක හදුනා ගැනීමට උපදෙස් ලබා දෙන ලදි

	කර නොතිබුණි.	
	ජාතික ප්‍රතිපත්ති වලට අනුකූලව කසළ කළමාණාකරන සැලැස්ම සකස් කර නොතිබුණි.	ජාතික ප්‍රතිපත්ති වලට අනුකූලව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.
	සභා බල ප්‍රදේශයේ කසළ වෙන් කර ගැනීමක් සිදු නොවේ.ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබීම.	මේ සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලිපි ඉදිරිපත් කර ඇත.
	කසළ අපහරණය කිරීම /කසළ කළමනාකරණය කිරීම සඳහා සභාව විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබීම.	දිරණ කසළ කසලකළමණාකරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක අතර ඒ අනුව ඉඩම් කොටසක් පවරා ගැනීමට අදාලව ඉදිරි වැඩ කටයුතු සිදුකරමින් පවති. නොදිරන කසළ එක්රැස් කර විධිමත් ප්‍රසම්පාදන ක්‍රමයක් යටතේ අලෙවි කරනු ලබයි.
	වරිපනම් කළාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට මධ්‍යස්ථානයක් නොමැති බැවින්, දිරන කසල එක්රැස් කරනු නොලබන බැවින් ගාස්තු අය කර නොමැත.
	ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රතිචක්‍රිකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්ම වැඩපිළිවෙලක් නොතිබිණි.	ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රතිචක්‍රිකරණය සඳහා යොමු කිරීමේ වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මක වේ.
	පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	මේ වන විට හඳුනාගත් සියලු ආයතන සඳහා පරිසර බලපත්‍ර නිකුත් කර ඇති අතර තවදුරටත් එවැනි ආයතන හඳුනා ගැනීම සඳහා සම්ක්ෂණ කටයුතු සිදු කරමින් බව කාරුණිකව සඳහන් කරමි.

	අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	2023 වර්ෂයේ දී අතිරික්ත නිලධාරීන් 12 ක් සිටි අතර 2026 වර්ෂය වන විට අතික්තව නිලධාරීන් 05 දෙනෙක් දක්වා අඩු වී ඇත. තවද අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ඇති බව කාර්ය මණ්ඩල කාර්තු වාර්තා මඟින් සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් වෙත දැනුම් දී ඇති බව කාරුණිකව සඳහන් කරමි.
	2020.08.28 දිනැති 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යය භාරය පැහැදිවන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්යය සාධක දර්ශක 03 ක් හඳුනා ගෙන නොතිබිණි	2025 අයවැය ලේඛනයේ දී කාර්යසාධන දර්ශකවලට සමගාමීව ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඊට අදාලව ප්‍රතිපත්ති ප්‍රකාශය තුලින්ද කරුණු ඉදිරිපත් කර ඇත.
401	**ආයතනයේ නම : කහවත්ත ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මටටමේ/ව්‍යාවන මටටමේ/අභිතකර මටටමේ විය. ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. ඇස්තමේන්තු ලෙජරය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනය, ඉඩම් හා ගොඩනැගිලි ලේඛණය, මාර්ග ඉන්වෙන්ට්‍රිය, ඇස්තමේන්තු ලෙජරය, ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය යන ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.

	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීන පවත්වා නොතිබුණි,	
	ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ගල් හා බොරලු ලේඛනයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැත මක්නිසාදයත් ආයතනය තුල අදාල ද්‍රව්‍ය ගබඩා කිරීමක් සිදු කරනු නොලබයි.
	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිලිතුරු නොසැපයූ අවස්තා වාර්තා විය.	අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති ඉදිරිපත් කරනු ලබයි.
	මු.රෙ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	
	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදි පිළියෙල කර නොතිබුණි. සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණ වාර්තා නිසි පරිදි කටයුතු කරනු ලබයි.
	වාහන ගර්භිත වී මාස 8ට වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි.	
	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුනි.	ගර්භිත වාහන අපහරණ කටයුතු සිදු කර ඇත. බැංකු සැසඳුම් ප්‍රකාශ සම්බන්ධ ශේෂ මසක් තුල නිරවුල් කර ඇත.

	හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුනි	
	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	හිඟ වරිපනම් සඳහා රතු නිවේදන නිකුත් කර ඇත.
	කසළ අපහරණය කිරීම/ කසළ කලමනාකරනය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.	කසළ වෙන් වෙන් වශයෙන් එක් රැස් කරනු ලබන අතර බ්‍රෙල් යන්ත්‍රයක් මගින් බ්‍රෙල් කර විකිණීම සිදු කරනු ලබයි.
	වරිපනම් කළාපය ඇතුලත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුනි. ප්ලාස්ටික් සහ පොලිතීන් ප්‍රතිවක්තිකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිලිවෙලක් නොතිබුණි.	
	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම් කර ඇත.
	2020.08.28 දිනැති 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	2020.08.28 දිනැති 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක අනුව කටයුතු කරමින් පවති.
402	**ආයතනයේ නම : අයගම ප්‍රාදේශීය සභාව**	

	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත් මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2023 වර්ෂයට අදාළව අයගම ප්‍රාදේශීය සභාව විසින් සකසන ලද අවසාන ගිණුම් ප්‍රකාශයට අදාළව තත්වාගණනය කරන ලද විගණන මතයක් ඉදිරිපත් වී ඇති අතර 2024, 2025 වර්ෂයන්හිදී ද තත්වාගණනය කරන ලද විගණන මතයක් ලැබී ඇත.
	මිණුම් පොත යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	මෙම වකවානුව තුළ මිණුම් පොත් කාර්මික නිලධාරීන් විසින් ප්‍රායෝගිකවකව භාවිතා කරනු නොලබන අතර ආදේශකයක් වශයෙන් ක්ෂේත්‍ර සටහන් පොත (FIELD NOTE BOOK) භාවිතා කරනු ලබයි.
	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	අංක 2416/44 හා 2024.12.27 දිනැති රජයේ ගැසට් පත්‍රය මඟින් අයගම - ඉඩංගොඩ අතුරු මාර්ග 189 ක් හා අංක 2469/20 හා 2026.01.01 දිනැති රජයේ ගැසට් පත්‍රය මඟින් කලවාන - අයගම අතුරු මාර්ග 407 GIS තාක්ෂණය ඔස්සේ සිතියම් ගත කිරීම සිදු කර ඇති බවත් අයගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාර්ග සිතියම්ගත කිරීම සාර්ථකව අවසන් කර 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව අවස්ථා 02ක ගැසට් පත්‍ර සමඟින් ප්‍රකාශයට පත්කර ඇති බවත් එම ගැසට් නිවේදන මාර්ග ඉන්වෙන්ට්‍රිය ලෙස පවත්වාගෙන යනු ලබන බවත් දන්වමි.
	ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛනය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබයි.
	ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.	ගල් හා බොරළු ලේඛනයක ආකෘතියක් සකස් කර පවත්වාගෙන යනු ලබයි.
	මෘදුකාංගයට අදාළ මුරපද	ප්‍රායෝගික වශයෙන් රාජ්‍ය ආයතනයන්හි මාස 03කට වරක් මුරපද සංශෝධන ක්‍රියාවලිය සිදු නොකරන අතර ඉදිරියේ දී අදාළ කාර්යය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි.

	තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	
	මු.රෙ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර සභා අනුමැතිය ලබා ගෙන ඇති අතර 2026 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි.
	සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	ආයතන පරිශ්‍රයේ පවතින භෞතික වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දිවා රාත්‍රී මුරකරුවන් විධිමත් පරිදි යෙදවීමට කටයුතු යොදා ඇති අතර හදුනාගෙන ඇති නිශ්චල දේපළවල සුරක්ෂිතභාවය වෙනුවෙන් නිරවුල් කිරීම් හා ලේඛනගත කිරීමත් වාර්ෂික සමීක්ෂණ පැවැත්වීමත් සිදුකිරීමට පියවර ගෙන ඇති බව දන්වමි. සභාව සතු ඉඩම්වල ආරක්ෂාව සඳහා මායිම් කණු යෙදීම ඉදිරියේ දී මහ සභා තීරණයකට යොමු කර සිදු කිරීමට කටයුතු කිරීම.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 හා 2022 වර්ෂයන්හි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන්දේසි නොවූ භාණ්ඩ තොගයන් 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට යොමු වී ඇති අතර 2023 භාණ්ඩ සමීක්ෂණයන්ගෙන් 90%ක් පමණ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත. පරිගණක උපාංග යන්ත්‍රෝපකරණ වෙන්දේසි කිරීමේ අවස්ථා සියල්ලෙහිදීම ගැනුම්කරුවන් ඉදිරිපත් නොවූ හෙයින් 2024 භාණ්ඩ සමීක්ෂණයට ද යොමු කර අදාළ වෙන්දේසි කටයුතු සිදුකිරීමට කටයුතු කළ ද අදාළ වෙන්දේසි කටයුතු සිදු නොවූ හෙයින් 2025 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මත පහත තීරණ වලට එළඹී ඇත. භාවිතයට ගත නොහැකි පරිගණක උපාංග වෙන්දේසි නොවීම හේතුවෙන් කසළ අංගනයට ලබා දී එම අළෙවිය තුළින් ආයතනයට ආදායමක් ලබා ගැනීම නිර්දේශ වී ඇති අතර යතුරුලියන වැනි උපාංග භාණ්ඩ සමීක්ෂණය හරහා වෙන්දේසි නොවූ බැවින් අනාගත පරපුරට

		දැකබලා ගැනීම සඳහා ප්‍රදර්ශන භාණ්ඩයක් ලෙස සංරක්ෂණය කර පුස්තකාලයෙහි තැබීමට නිර්දේශ වී ඇත.
	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ට්‍රැක්ටර් රථයන්හි දෛනික ධාවන සටහන් හා මාසික වාර්තා පමණක් නියමිත දිනට කාර්යාලයට ලබා දී නොතිබූ අතර ප්‍රමාද වී අදාළ වාර්තා යොමු කර ඇත. ඉදිරියේ දී එවැනි අඩුපාඩු සිදු නොවීම පිණිස ලිපි මඟින් රියදුරන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.
	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි. හිඟ හිටි බදු කුලී අයකර ගැනීම සම්බන්ධව අදාළ ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදාළ පාර්ශව හඳුනාගෙන මූලික ලිපි ඉදිරිපත් කර හිඟ වාරික අයකිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වමි.
	සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.	සභාවට අදාළ ප්‍රගාමී තොරතුරු ප්‍රදර්ශනය කරමින් අන්තර්ජාල වෙබ් අඩවිය හා ෆේස් බුක් පිටුව යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවති
	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ කටයුතු වෙනමම සිදු නොකරන නමුත් එම අපද්‍රව්‍ය කසළ අංගනයට රැගෙනවිත් වර්ග අනුව වෙන් කර අළෙවි කිරීම සිදු කරනු ලබයි.
	කසළ අපහරණය/ කසළ කළමනාකරණය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර	කසළ අපහරණය ආයතනය තුළ සිදු නොකරන අතර කසළ අපහරණය වෙනුවට නොදිරන කසළ එකතු කර විකිණීම සිදු කරනු ලබයි. දිරන කසළ වළ දැමීමේ කාර්යය සභාව මඟින් සිදු කරනු ලබයි.
		අයගම ප්‍රාදේශීය සභාව සතු වරිපනම් කලාපය සීමිත බැවින් කසළ අයකිරීමේ බද්දක් වශයෙන් මුදල් අයකිරීමකින් තොරව අපද්‍රව්‍ය එකතු

	නොතිබුණි. වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි. ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය බඳවා ගෙන තිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කිරීම සිදු කරයි. වරිපනම් කලාපය පුළුල් කිරීමෙන් අනතුරුව මුදල් අයකිරීමට කටයුතු කිරීම පිළිබඳව අවධානය යොමු කර ඇති බව කාරුණිකව දන්වමි. අභ්‍යන්තර විගණන සැලැස්මට සමගාමීව පුරවැසි ප්‍රඥප්තිය මඟින් සිදු කරනු ලබන සේවාවන් කාර්යය නිම කිරීමට ගතවන අවම කාලය තුළ නිම කිරීමට සමත් වී ඇත්ද යන්න අධීක්ෂණය කිරීම අභ්‍යන්තර විගණන රාජකාරිය පවරා ඇති නිලධාරියා වෙත රාජකාරි පැවරීම හරහා ලබා දී ඇත. අනුමත සීමාව ඉක්මවා අතිරික්ත කාර්යය මණ්ඩලයක් පවතිනුයේ සංවර්ධන නිලධාරී තනතුරට අදාළවය. එහි අනුමත තනතුරු 11ක් වන අතර 2023.12.31 දිනට අතිරික්ත කාර්යය මණ්ඩලය ද 11ක් සේවයේ නියුක්තව සිටින අතර සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්වීම් ලබා දී සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් විසින් අප ආයතනය වෙත අනුයුක්ත කර ඇත. 2026 වර්ෂයේ මේ වන විට එම අතිරික්ත නිලධාරී සංඛ්‍යාව ස්ථාන මාරු ලබා දීම හේතුවෙන් 05ක් දක්වා අඩුවී ඇත. අයවැය ලේඛන සකස් කරනුයේ උපචිත පදනම මත බැවින් හා උපයාගන්නා ලද ආදායම 2023 වර්ෂයේ අඩු බැවින් අත්‍යවශය පුහුණු වැඩසටහන් සඳහා වාර්ෂික අයවැය ලේඛනය වෙනුවෙන් 2023 වර්ෂයේ වියදම් දැරීමට සිදුවූයේ 50%ක පමණ ප්‍රමාණයකි. නමුත් 2023 වර්ෂයට සාපේක්ෂව 2026 වර්යේ ජූනි මස වන විට 50%කට වඩා වැඩි ප්‍රමාණයක් පුහුණු අවශ්‍යතා වෙනුවෙන් වැය දැරීම් සිදු කර ඇත. විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කල හැකි නිර්දේශ ක්‍රියාත්මක කර ඇති බව තහවුරු කරමි. 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1

	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කල හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යයභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03 හඳුනාගෙන නොතිබුණි.	ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යයභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03 රාජ්‍ය ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව පරිහරණය කිරීම තහවුරු කිරීම අරමුණු කරමින් ආයතනය විසින් හඳුනාගෙන ඇත. I. <u>වාර්ෂික අයවැය උපයෝජන ප්‍රතිශතය</u> ආයතනයට වෙන් කරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන නියමිත කාල සීමාවක් තුළ සැලසුම්ගත පරිදි කාර්යක්ෂමව වියදම් කර ඇත්දැයි මැන බැලීම. <u>ඉලක්කය</u> - අනවශ්‍ය වියදම් සීමා කරමින් වෙන් කළ ප්‍රතිපාදන 95% - 100% ත් අතර ප්‍රමාණයකින් ඵලදායී ලෙස කාර්යයන් සඳහා යෙදවීම II. <u>ප්‍රසම්පාදන සැලසුම් අනුකූලතා ප්‍රතිපාදන</u> චක්‍රලේඛ උපදෙස් අනුව මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා වසර ආරම්භයේදී සකස් කළ ප්‍රසම්පාදන සැලසුමට අනුකූලව නියමිත කාල රාමුව තුළ ප්‍රසම්පාදන කටයුතු කොපමණ ප්‍රමාණයක් නිම කර ඇත්දැයි මැනීම. <u>ඉලක්කය</u> - ප්‍රසම්පාදන ප්‍රමාණයන් අවම කරමින් 90%කට වඩා ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීම. III. <u>මෙහෙයුම් පිරිවැය කාර්යක්ෂමතා දර්ශකය</u> චක්‍රලේඛයේ මූලික අරමුණක් වන“ වියදම් කළමනාකරණය හා සීමා කිරීම “ යන කරුණ ඉටු කරමින් ආයතනයේ එදිනෙදා උපයෝගිතා වියදම් (විදුලිය, ජලය, සන්නිවේදනය, ඉන්ධන සහ අතිකාල දීමනා) පසුගිය වර්ෂයට සාපේක්ෂව පාලනය කර ඇති ප්‍රමාණය මැනීම. <u>ඉලක්කය</u> - සේවා සැපයීමේදී ගුණාත්මකභාවයට හානියක් නොවන පරිදි ඉලක්කගත උපයෝගිතා වියදම් අවම වශයෙන් 10% කින් අවම කර ගැනීම.
403	**ආයතනයේ නම : කුරුවිට ප්‍රාදේශීය සභාව**	

	ආයතනයේ ගිණුම් පිළබඳ විගණන මතය	තත්වාගණනය කළ මතය
	ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය	ඇත
	හානි පිළිබඳ ලේඛනය	නැත
	ණය ගැනි ලේඛනය	මේ වන විට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ
	මිනුම් පොත්	නැත
	ඇස්තමේන්තු ලෙජරය	නැත
	ගල් හා බොරළු ලේඛනය	නැත
	ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනට අනුමත කර ගෙන නොතිබීම	
	අභ්‍යන්තර විගණණ වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම	2003 වර්ෂයට අදාලව අනුමත කර ගෙන නොතිබුණද,2024,2025,2026 වර්ෂයන්ට අදාලව අනුමත කර ගෙන ඇත
	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් පවත්වා නොතිබීම	ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
	සියළුම වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබීම	වර්ෂයකට වාර 4ක්(කාර්තුවකට අදාලව) සෑම වර්ෂයකම පවත්වා ඇත.
	සියළුම වාහනවල අයිතිය තහවුරු	CCTV කැමරා සවි කිරීමට කටයුතු කර ඇත.

	කරන ලිපි සන්තකයේ නොමැති වීම	අනෙකුත් ඉඩම් මැන බෝඩ් ගසා වෙන් කර,වැටවල් ගැසීම සිදු කරමින් පවතී.
	වාහන ගර්හිත වී මාස රිකට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම	එක් වාහනයක පමණක් ලිපි සකසා නොමැත. RX4389කම්පැක්ටර් රථය අපහරණය නොකරන ලෙස සබරගමුව ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ CM/AC/04/06-01 සහ 2025.09.29 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.
	ජංගම ගිණුමේ අතිරික්ත මුදල් කාලීන තැන්පතුවල සුදුසු පරිදි ආයෝජනය කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කර නොතිබීම	ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ඇත.
	වර්ෂයට අදාල බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක පැවතීම	2023 වර්ෂයේ බිල්කල වටිනාකම පහළ මට්ටමක පැවතීමට හේතුව ග්‍රාම සේවා වසම් 56න් සමන්විත වන කුරුවිට ප්‍රාදේශිය සභාවේ ආදායම් පරීක්ෂක තනතුරු 03 පැවැතිය ද බෝහෝ කාලයක් පුරප්පාඩුව පැවති ආදායම් පරීක්ෂක තනතුරින් 01 ක් 2025 වසර අගභාගයේදී සම්පුරණ වී ඇත. තවදුරටත් ආදායම් පරීක්ෂක තනතුරක් පුරප්පාඩු ඇත. එබැවින් වෙළඳ බලපත්‍ර ගාස්තු දැන්වීම් පුවරු ගාස්තු සමස්ථ හෝටල්වල අයකිරීමට ඇති 1% බදු ප්‍රමාණය ආදී විවිධ ආදායම් ප්‍රභවයන්ගෙන් අදායම් රැස්කරන අතරතුර බිල්කල වටිනාකම් අයකිරීමට ආදායම් පරීක්ෂකවරුන්ට සිදු වී ඇත. එසේම 2026 වසරේ බිල්කල වටිනාකම නව තක්සේරුව සමඟ වැඩි වී ඇති බැවින් අයකර ගැනීම් කටයුතු සිදු කිරීම සඳහා 2026.02.02 දින රැස් වූ ආදායම් කමිටුව විසින් තවත් නිලධාරීන් 03ක් ආදායම්

		පරීක්ෂකවරුන්ට අමතරව යෙදවීමට තීරණය කරන ලදි. ඒ අනුව ආදායම් අයකිරීමට කටයුතු කරන බවත්, අදාල බදු මුදල් නොගෙවන්නන් වෙත ඉදිරියේදී 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත අනුව කටයුතු කරමි.
		මේ වන විට සිදු කර ඇත.
		2024 සිට මේ දක්වා දර්ශක සකස් කරමින් සැලැස්මක් සකසා ඇත.
	ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර බදු අය කර ගැනීම සඳහා සමීක්ෂණ පැවැත්වීමක් සිදු කර නොතිබීම	කසළ කළමනාකරණ සැලැස්මක් සකසා මහ සභාවේ අනුමත කර ගෙන ඇත.
	හදුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි	නැත
	ජාතික ප්‍රතිපත්තිවලට අනුනුකූලව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි.	නැත
	ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙළක් නොතිබීම	ඉල්ලීම් කර ඇති අය සඳහා පමණක් ලබා දී ඇත.
	වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථානවලින් සහ ආයතනවලින් රැස්	

	කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබීම.	නැත
	පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබා ගත යුතු සියළු ආයතන පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.	නැත
	ආයතනයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීම.	
	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබීම	මේ වන විට 50%ක මට්ටමක වඩා වැඩිවී ඇත
	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතීම	
404	**ආයතනයේ නම : වැලිගෙපොල ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2024.12.31 අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ විගණන මතය තත්ත්වාගණන මතයක් වේ.

	මිනුම් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මිනුම් පොත් ආකෘතියට පරිගණකය මගින් සකසා ගත් පැතුරුම්පත් ආකෘතියක් භාවිතා කරයි.
	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ජී.අයි.එස්. තාක්ෂණය ඔස්සේ සකස් කරමින් පවතී.
	ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	නැත
	මු.රෙ.ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ආයතනය තුළ අභ්‍යන්තර විගණන වාර්තා ආයතන ප්‍රධානියා වෙතත්, පළාත් අභ්‍යන්තර විගණනය වෙතින් ඉදිරිපත් කරන විගණන වාර්තා විගණකාධිපති වෙතත් ඉදිරිපත් කරනු ලැබේ.
	සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි	සභාව සතු දැනට පවතින වත්කම් හඳුනා ගෙන ඇති අතර ඒවා පවරා ගැනීම සඳහා ඕපනායක හා වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් වෙත ලිපි යොමු කර ඇත.
	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා පිළිබඳ නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	එම වර්ෂය තුළදීම ඉතා කඩිනමින් නිවැරදි කර ගන්නා ලදී.
	වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	සභාව සතු 270-2903 ටැඳේ ට්‍රැක්ටරය/RA -7230 ට්‍රැක්ටරය/67-3515 ට්‍රැක්ටර් ට්ලෙරය/LF -4847 මහින්ද්‍රා කැබ් රථය/ 53-5637 කැබ් රථට/340-2151 අත් ට්‍රැක්ටරය යන වාහන අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීමේ කමිටුව විසින් අපහරණය කලයුතු බවට වාර්තා ලබා දී ඇති අතර අපහරණය කළ යුතු වාහන තක්සේරු කිරීමේ කමිටුව පැවැත්වීම සඳහා නිළධාරීන් පත් කර ගැනීමට මේ වන විට කටයුතු සිදු කරමින් පවතී.

	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩපිළිවෙලක් නොතිබුණි.	මේ වන විට ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම එකතු කරනු ලබයි.
	කසළ අපහරණය කිරීම/කසළ කළමනාකරණය කිරීම සඳහා සභාව විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට දිරණ නොදිරණ ලෙස වෙන් කර අපද්‍රව්‍ය එකතු කරන අතර නොදිරණ කසල ප්ලාස්ටික් ,වීදුරු, PET පොලිතීන් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ලෙස වෙන් කර බේල් කර අලෙවි කිරීම සිදු කරනු ලබයි.
	අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි	අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් 2026 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත.
	අතුරු ව්‍යවස්ථාව පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලය,ගල්පාය සෙවන පුස්තකාලය, වැලිගෙපොල නිදහස් ස්වර්ණ ජයන්ති පුස්තකාල වල මහජන ප්‍රදර්ශනය සඳහා අතුරු ව්‍යවස්ථා තබා ඇත.පෙරටු කාර්යාලයේ ද අතුරු ව්‍යවස්ථා ප්‍රදර්ශනය සඳහා තබා ඇති අතර වෙබ් අඩවිය ඔස්සේ ද අතුරු ව්‍යවස්ථා ප්‍රදර්ශනය කර ඇත.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි.	2022 වර්ෂයේ දී වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ නව ව්‍යාපෘතියක් ලෙස ඕපනායක හෙළ බොජුන් සහ ගලි ප්‍රතිකාරක මධ්‍යස්ථානය ආරම්භ කිරීමත් සමඟ වැලිගෙපොල හා ඕපනායක කොට්ඨාස වල කසල නොදිරණ හා දිරණ ලෙස වෙන් කර ලබා ගැනීම නිසා සිටින සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන නිසා සේවා අවශ්‍යතාවය මත සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන ලදී.
	සැලසුම් ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය	දැනට සැලසුම් කර ඇති පුහුණු අවස්ථා 60% ඉක්මවා සිදු කර ඇත.

	50% වඩා අඩු මට්ටමක පැවතුණි . විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. 2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්ය භාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03 ක් හඳුනා ගෙන නොතිබුණි.	ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී. 2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්ය භාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03 ක් සිව් අවුරුදු සැලැස්මට ඇතුළත් කර ඇත.
404	**ආයතනයේ නම : නිවිතිගල ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ණයගැති ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛණය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. ගල් හා බොරළු ලේඛණය නිසි පරිදි	තත්වාගනනය කල මතයකි මේ වන විට ණයගැති ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි. ද්‍රව්‍ය ආපසු භාර දීමේ ලේඛණයක් පැවතිය ද එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගුණ බැවින් ලේඛණය යාවත්කාලීන කර නොමැත.

	යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	එවැනි ලේඛණයක අවශ්‍යතාවයක් පැන නොනැගුණ බැවින් එවැනි ලේඛණයක් පවත්වාගෙන යනු නොලබයි.
	මු.රෙ ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නියමිත දිනට එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
	සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරුකරගෙන නොතිබුණි.	නිවිතිගල ප්‍රාදේශිය සභාව සතු සුසානභූමි,ක්‍රීඩා පිටි,ප්‍රජා ශාලා වැනි ස්ථාවර වත්කම් වසම් මට්ටමින් හඳුනාගැනීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන බවත් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බවත් දන්වමි.
	භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට භාණ්ඩ සමීක්ෂණයට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
	තොරතුරු නිලධාරියා/නිලධාරීන් සහ නම් කළ නිලධාරියා (අභියාචන නිලධාරියා) පිළිබඳ දත්ත මහජනතාවට ප්‍රදර්ශනය කර නොතිබුණි.	එම තොරතුරු ප්‍රදර්ශනය කිරීම සඳහා නාමපුවරුවක් සකස් කර පෙරටු කාර්යාලයේ සවිකර ඇති බව දන්වමි.
	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස්කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමට නිශ්චිත ක්‍රමවේදයක් නොමැති බැවින් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය රැස්කිරීම නොකරනු ලබයි.
	වරිපනම් කලාපය ඇතුලත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි.	කසළ සමීක්ෂණයක් සිදු කොට ගාස්තු අයකිරීමට ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.

	පලාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ දී නිකුත් කර ඇති මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව සීමිත ආයතන ප්‍රමාණයක් පමණක් ප්‍රාදේශීය සභාව මඟින් බලපත්‍ර නිකුත් කිරීමට පැවරී ඇති බැවින් සහ එම චක්‍රලේඛයේ ප්‍රකාරව ප්‍රදේශයේ ඇති හෝටල් සහ අනෙකුත් ආයතන අවම සුදුසුකම්වත් සපුරා නැති බැවින් පරිසර බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි වී ඇත.
	ආයතනයේ පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.	කාර්තුමය වශයෙන් පවත්වනු ලබන කාර්ය මණ්ඩල රැස්වීම්,විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සහ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් මගින් කාර්යයන් වල ප්‍රගතිය විමසීම් සිදු කර පසුවිපරම් සිදුකරනු ලබයි.
	අනුමත සිමාව ඉක්මවා කාර්යමණ්ඩල බඳවාගෙන තිබුණි.	2025.12.31 වන දිනෙන් අවසන් වර්ෂය වන විට එක් සංවර්ධන නිලධාරියෙකු සහ සෞඛ්‍ය කම්කරු තනතුරු 02 ක් පමණක් අනුමත සිමාව ඉක්මවා පවතී.
	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම්කල හැකි කාර්යසාධක දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	මේ වර්ෂය තුළදී විධිමත් පරිදි කාර්යසාධන දර්ශක හඳුනා ගෙන ප්‍රකාශයට පත්කරන බව දන්වා සිටිමි.
	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කොට ඇත.(මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගේ පමණක්)

405	ආයතනයේ නම : ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව	
	සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පෙබ.28 දිනට පෙර ඉදිරිපත් කර නොතිබීම.	2024 හා 2025 වර්ෂ වල නියමිත දිනට ඉදිරිපත් කර ඇත.
	ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ වීම.	2024 හා 2025 වර්ෂ වලදී තත්වාගණනය කල මතයක් ලබා ඇත.
	මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන නොවීම.	දැනට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
	ඇස්තමේන්තු ලෙජරය යාවත්කාලීන නොවීම.	පරිගණක මෘදුකාංගයක් මඟින් ඇස්තමේන්තු සකස් කරන අතර ඒවා අදාළ ව්‍යාපෘති ගොනුවලට ගොනු ගත කර ඇත.
	ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය යාවත්කාලීන නොවීම.	දැනට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
	ගල් හා බොරළු ලේඛනය යාවත්කාලීන නොවීම.	අප ආයතනය මඟින් සෘජු ශ්‍රම කර්මාන්ත සිදු නොකරන බැවින් ගල් බොරළු තොග පවත්වා ගෙන යනු නොලබයි.
	මු.රෙ.ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම.	ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
	සියලු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබීම.	මේ වන විට වත්කම් ලෙස හඳුනාගෙන ඇති බොහෝමයක් වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ඇත.

	භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම.	මේ වන විට අදාළ දින ට ඉදිරිපත් කර ඇත.
	වාහනයක් ගර්භිත වී මාස 8 ට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම.	අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
	වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක වීම.	ජංගම සේවා වැඩසටහන් හා ඒකක පසුපස හඹා යෑම මඟින් බිල් කළ ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.
	හිඟ වරිපනම් අය කර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කර නොතිබීම.	දේපල තහනම් කිරීමේ ක්‍රියා මාර්ගය ඔස්සේ යමින් හිඟ වරිපනම් අය කර ගැනීමට කටයුතු කර ඇත.
	ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබීම.	2026 වර්ෂයේදී සභාව වෙත කසළ කළමනාකරණය සඳහා භූමියක් ලැබී ඇති අතර මේ වන විට සැලැස්මක් සකස් කර ඇත.
	සභා බල ප්‍රදේශයේ කසළ වෙන් කර ලබා ගැනීමක් සිදු නොවීම.	2026 මැයි මාසයේ සිට කසළ වෙන් කර ලබා ගැනීම ක්‍රියාත්මක කරමින් පවතී.
	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබීම.	සැලසුම් සකස් කරමින් පවතී.
	කසල අපහරණය කිරීම/ කසළ කළමනාකරණය කිරීම සඳහා සභාව විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක	මේ වන විට සැලසුම් සකස් කරමින් පවතී.

	කර නොතිබීම.	
	ප්ලාස්ටික් සහ පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් නොතිබීම.	කසළ වෙන් කිරීමෙන් අනතුරුව පොලිතීන් සහ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ විධිමත් වැඩපිළිවෙලක් සකස් කරමින් පවතී.
	අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබීම.	මහජන පරිශීලනය සඳහා පෙරටු කාර්යාලයේ පවත්වාගෙන යනු ලබයි.
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබීම.	මේ වන විට මානව සම්පත් සැලැස්ම පිළියෙළ කර ඇත.
	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50 % කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබීම.	මේ වන විට කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට පැය 12 කට නොඅඩු පුහුණුවක් ලබා දීමට කටයුතු සිදු කර ඇත.
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබීම.	කාර්ය මණ්ඩල සමාලෝචනයේදී මේ පිළිබඳව දැනුවත් කර ඇත.
	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ	මේ වන විට විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කර ඇත.

	ක්‍රියාත්මක කර නොතිබීම.	
406	**ආයතනයේ නම : කොලොන්න ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ මතය, යටත්ව මට්ටමේ/ව්‍යවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය	2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සඳහා තත්ත්වාගණන මතයක් ලැබී ඇත.
	ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි	මේ වන විට ගල් හා බොරළු ලේඛනය යාවත්කාලීන කර ඇත
	මාසිකව වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලනය කර සහ අදාල සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි	මාසිකව වැටුප් ලේඛන සහ පාලන ගිණුම් තුලනය කර අදාල සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඇත
	මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි	මේ වන විට මෘදුකාංග වලට අදාළ මුරපද තුන් මසකට වරක් වෙනස් කිරීමට කටයුතු කර ඇත
	ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි	ප්‍රධාන සංයුක්ත සැලැස්ම මේ වන විට සකස් කර ඇත
	සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි	සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර ගෙන ඇත
	සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි	මේ වන විට සංයුක්ත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත

	මු.රෙ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	මේ වන විට මු.රෙ. ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත
	විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි	මේ වන විට නිවැරදි කර ඇත
	සියළු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි	ප්‍රතිපාදන සැලසී ඇති පරිදි මේ වන විට වත්කම් වල ආරක්ෂාව තහවුරු කර ඇත
	වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි	මෙම වාහන අලුත්වැඩියා කිරීම සුදුසු බවට 2025.10.08 දින පැවති කාර්මික කමිටුව තීරණය කළ අතර කුරුවිට සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ ඉංජිනේරුතුමා විසින් 2026.01.03 දින වාහන පරීක්ෂා කරන ලදි. ඒ අනුව ලබා දෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරමි.
	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි	මේ වන විට නිවැරදි කර ඇත
	ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපල සමාලෝචිත වර්ෂය තුලදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි	2026 වර්ෂයට අදාළව බදු දිය යුතු දේපල ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දී ඇත

	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපල සඳහා එළඹිය යුතු ගිවිසුම් සියල්ල පූර්ණ ලෙස ඉටුකර නොතිබුණි	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් දේපල සඳහා එළඹිය යුතු ගිවිසුම් සියල්ල මේ වන විට සම්පූර්ණ කර ඇත
	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියළු දේපල සඳහා අය විය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අය කර නොතිබුණි	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියළු දේපල සඳහා අය විය යුතු සියළු බදු මුදල් අය කර ගෙන ඇත
	වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථානවලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි	2026 වර්ෂයේදී පළමු වරට වරිපනම් බදු අය කිරීමේ කටයුතු සිදු කරනු ලබන අතර අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කිරීමේ කටයුතු පිළිබඳව ඉදිරියේදී තීරණයක් ලබා ගෙන අය කිරීමට කටයුතු කරමි.
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි	මේ වන විට මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇත
	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි	මේ වන විට අදාළ පුහුණු අවස්ථා සලසා දීමට කටයුතු කර ඇත
	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි	ආයතනයේ පවතින විවිධ සේවා අවශ්‍යතාවයන් මත බඳවා ගැනීම් සිදු කර ඇත

	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් 50% කට වැඩි පුහුණු අවස්ථා ලබා දී ඇත
	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි	මෙ වන විට විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර ඇත
	සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි	සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත
407	**ආයතනයේ නම : පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	විගණකාධිපති විසින් විසින් ඉදිරිපත් කර ඇති SGLG/RT/A/PMPS/FA/A4/05/2023/08 හා 2024 අප්‍රේල් 24 දිනැති විගණකාධිපති වාර්තාව මගින් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ තත්ත්වාගණනය කල මතයක් ප්‍රකාශ කර ඇත.
	ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ගල් හා බොරළු ලේඛනයක් පවති.ප්‍රාදේශීය සභාව සතු මාර්ග සඳහා ගල් හා බොරළු ඇතිරීමක් වර්තමානයේ සිදු නොවූ බැවින්,යාවත්කාලීන කර නොමැත.එවැනි අවස්ථාවක් උද්ගත වුවහොත් භාවිතයට ගනිමි
	වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	දීර්ඝ කාලයක සිට අය කර ගත නොහැකිව පැවති හිඟ ආදායම් අය කර ගැනීම සඳහා ආදායම් පරීක්ෂකවරියට අමතරව වෙනත් නිලධාරීන් යෙදවීමටත්,ප්‍රගතිය සමාලෝචනය කිරීමටත් කටයුතු කරන ලදි.නොගෙවන ලද වරිපනම් සම්බන්ධයෙන් දේපල තහනමට ගැනීමේ ක්‍රියාවලියද සිදු කරන ලදි.අයකර ගත නොහැකිව ලේඛන ගතව පවතින ආදායම් (ත්‍රී රෝද රථ ගාස්තු) විධිමත් පරිදි කපා හැරීමට ක්‍රියා මාර්ග ගෙන ඇත.නොගෙවන ලද දැන්වීම් පුවරු ඉවත් කිරීමටත්,කටයුතු කරන ලදි. තව දුරටත් ආදායම් අය

		කිරීම සැලසුම් සහගතව ඉටු කිරීමටත්, ප්‍රගතිය සමාලෝචනය කරමින් ආදායම් අය කිරීම ප්‍රශස්ථ මට්ටමට ගෙන ඒමටත් කටයුතු කරමි.
	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියළු දේපල සඳහා අය විය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අය කර නොතිබුණි .	මාළු කඩ කුළි සම්බන්ධයෙන් හිඟ හිටි බදු මුදල් අය කර ගැනීම පිණිස නීත්‍යානුකූල පියවර ගෙන ඇත.අනෙකුත් බදු මුදල් සම්බන්ධයෙන් හිඟයක් නොපවතී.
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	නිලධාරියෙකුට විධිමත් ලෙස රාජකාරී පවරා ඇත.දැන් අදාළ චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත.
	සකස් කර ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	පුහුණු සැළැස්ම අනුව, හැකිතාක් ක්‍රියා කරන අතර,දෙපාර්තමේන්තුව හරහා සිදු කරනු ලබන පුහුණු වැඩ සටහන් සඳහා ද ,නිලධාරීන් යෙදවීමටද ක්‍රියා කර ඇත.
	අනුමත සීමාව ඉක්වමා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	ප්‍රදේශයේ ජනතාවගේ සනීපාරක්ෂක කටයුතු ඇතුළු අනෙකුත් සේවා සම්පාදන කාර්යයන්හි දී අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාම සඳහා සිටින සේවකයින් කිසිසේත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අමතර සේවකයින් සේවයේ යෙදවීමට සිදු විය. මෙම සේවකයින් ද අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට ක්‍රියා කරමින් පවතී.
	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි	විගණන වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු හරහාත්, ආයතනික මට්ටමෙනුත් සාකච්ඡා කර මේ වන විට අදාළ ක්‍රියා මාර්ග ගෙන ඇත.

	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී නිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් 50% කට වැඩි පුහුණු අවස්ථා ලබා දී ඇත මේ වන විට විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර ඇත සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත
407	**ආයතනයේ නම : පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව**	
	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය. ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	විගණකාධිපති විසින් විසින් ඉදිරිපත් කර ඇති SGLG/RT/A/PMPS/FA/A4/05/2023/08 හා 2024 අප්‍රේල් 24 දිනැති විගණකාධිපති වාර්තාව මගින් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ තත්ත්වාගණනය කල මතයක් ප්‍රකාශ කර ඇත. ගල් හා බොරළු ලේඛනයක් පවතී.ප්‍රාදේශීය සභාව සතු මාර්ග සඳහා ගල් හා බොරළු ඇතිරීමක් වර්තමානයේ සිදු නොවූ බැවින්,යාවත්කාලීන කර නොමැත.එවැනි අවස්ථාවක් උද්ගත වුවහොත් භාවිතයට ගනිමි දීර්ඝ කාලයක සිට අය කර ගත නොහැකිව පැවති හිඟ ආදායම් අය කර ගැනිම සඳහා ආදායම් පරීක්ෂකවරියට අමතරව වෙනත් නිලධාරීන් යෙදවීමටත්,ප්‍රගතිය සමාලෝචනය කිරීමටත් කටයුතු කරන ලදි.නොගෙවන ලද වරිපනම් සම්බන්ධයෙන් දේපල තහනමට ගැනීමේ ක්‍රියාවලියද සිදු කරන ලදි.අයකර ගත නොහැකිව ලේඛන ගතව පවතින ආදායම් (ත්‍රී රෝද රථ ගාස්තු) විධිමත් පරිදි කපා හැරීමට ක්‍රියා මාර්ග ගෙන ඇත.නොගෙවන ලද දැන්වීම් පුවරු ඉවත් කිරීමටත්,කටයුතු කරන ලදි. තව දුරටත් ආදායම් අය කිරීම සැලසුම් සහගතව ඉටු කිරීමටත්,

		ප්‍රගතිය සමාලෝචනය කරමින් ආදායම් අය කිරීම ප්‍රශස්ථ මට්ටමට ගෙන ඒමටත් කටයුතු කරමි.
	වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියළු දේපල සඳහා අය විය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අය කර නොතිබුණි .	මාළු කඩ කුළි සම්බන්ධයෙන් හිඟ හිටි බදු මුදල් අය කර ගැනීම පිණිස නීත්‍යානුකූල පියවර ගෙන ඇත.අනෙකුත් බදු මුදල් සම්බන්ධයෙන් හිඟයක් නොපවතී.
	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	නිලධාරියෙකුට විධිමත් ලෙස රාජකාරී පවරා ඇත.දැන් අදාළ චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත.
	සකස් කර ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	පුහුණු සැළැස්ම අනුව, හැකිතාක් ක්‍රියා කරන අතර,දෙපාර්තමේන්තුව හරහා සිදු කරනු ලබන පුහුණු වැඩ සටහන් සඳහා ද ,නිලධාරීන් යෙදවීමටද ක්‍රියා කර ඇත.
	අනුමත සීමාව ඉක්වමා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	ප්‍රදේශයේ ජනතාවගේ සනීපාරක්ෂක කටයුතු ඇතුළු අනෙකුත් සේවා සම්පාදන කාර්යයන්හි දී අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාම සඳහා සිටින සේවකයින් කිසිසේත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අමතර සේවකයින් සේවයේ යෙදවීමට සිදු විය. මෙම සේවකයින් ද අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට ක්‍රියා කරමින් පවතී.
	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි	විගණන වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු හරහාත්, ආයතනික මට්ටමෙනුත් සාකච්ඡා කර මේ වන විට අදාළ ක්‍රියා මාර්ග ගෙන ඇත.

407	ආයතනයේ නම : ගොඩකවෙල ප්‍රාදේශීය සභාව	
	ගිණුම් පිළිබඳ විගණන මතය	තත්වාගණනය කල මතයක් ලැබී ඇත.
	වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	සභාවට අයත් ඉඩම් කට්ටි වල හිමිකම ප්‍රදර්ශනය කරමින් සහ ආරක්ෂිත වැටවල් ඉදිකර ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ කටයුතු සිදු කර ඇත.
	පවරා නොගත් වත්කම් තිබුණි.	සභාවට සතු සියළුම වාහන වල අයිතිය සභාවේ නමින් පවරා ගෙන ඇත.
	සියළු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	අයිතිය තහවුරු කිරීම සම්බන්ධයෙන් සියළුම වාහන වලට අදාළව වාහන පොත් සභාව සතුව ඇත.
	ටෙන්ඩර් මත වාර්ෂික බදු දිය යුතු සභාවේ දේපළ සමාලෝචිත වර්ෂය තුළදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.	මේ වන විට සභාවට අයත් දේපළ ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දීමට කටයුතු කර ඇති අතර ගොඩකවෙල සතිපොළ බදුකරු විසින් ගිවිසුම කඩ කිරීම මත එම ගිවිසුම අවලංගු කරන ලද අතර නැවත සභාව වෙත පවරා ගෙන පොළ ගාස්තු අය කරනු ලබයි. 2026 වර්ෂය සඳහා රක්වාන පොදු වැසිකිළිය හා සතිපොළ සඳහා ටෙන්ඩර්පත් කැඳවන ලද නමුත් ඒ සඳහා කිසිදු ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් වී නොමැති අතර ,රක්වාන සතිපොළ කඩකාමර අංක 12 සහ 24 තක්සේරු කිරීම සඳහා යොමු කර ඇති අතර තක්සේරුව ලැබීමෙන් අනතුරුව එම කඩ කාමර ටෙන්ඩර් කිරීමට කටයුතු කරමි.
	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කල හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කල හැකි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

ජේ.එම්.යූ.කේ. ජයසේකර
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත